gemcitymagazine.com

December 2024

# GEMCITY

## MAGAZINE OF RATNAPURA

HISTORY
HERITAGE
SCIENCE
TRAVELING
CULTURE
ENVIORNMENT
ART
ENTERTAINMENT

NO. 01

**WORK HARD**
GET SUCCESS

Released for free

*Distributed free of charge to government institutions, private institutions and businessmen.*

## Exclusive Articles

සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කරන හරිම විදිහ.

සොල්දාදුවෙක් මරණය අභියස සොයාගත් CocaCola

ස්වෝත්සාහයෙන් දියුණු වෙන්න කැමති ඔබට

f
X

CAPITOL TWINPEAKS

# නැවුම්

## ගෘහ නිර්මාණ ශිල්පයේ

# නිවුන්

## සන්ධිස්ථානයෙන්

## ඔබටත් ඉඩක්




**82%ක්**
**විකිණී අවසන්!**

**2025 මිල වැඩි වන්නට පෙර,**
**2024 දී ජීවිත කාලයක් පවතින**
**වටිනාම ආයෝජනයක්!**

| නිදන කාමර 2 | නිදන කාමර 3 | Jr. Penthouse |
|---|---|---|
| වර්ග අඩි 774-1063 | වර්ග අඩි 1045 -1321 | වර්ග අඩි 1833 |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| **71.7** | **91.7** | **220** |
| සිට | සිට | සිට |

වෙළඳපළ අනුපාතවලට වඩා අඩුවෙන් ණය පහසුකම්!

එකක මහල් 50කින් සමන්විත සුඛෝපභෝගී නිවාස ඒකක 475ක් සහිත නිවුන් නිවාස සංකීර්ණය, වර්ග අඩි 40,000ක නිදහස් පොදු සහ වාණිජ පහසුකම් රැසක් ඇතුළත්ව නිමවා ඇත. පනස් වෙනි මහලේ දී, මේ දෙපළ සම්බන්ධ කර ඇති දකුණු ආසියාවේ උසම අහස් පාළමට ගොඩ වී අපේ බටහිර අහසත්, සුන්දර ඉන්දියන් සාගරයත්, කොළඹ වරාය නගරය සේ ම, කොළඹ නගරයේ ආකර්ශණීය දසුන් රැසක් ඉහළ සිට දකින්න. ජාත්‍යන්තරව පිළිගත් සුපිරි අවන්හල්, ශරීර සුවතා මධ්‍යස්ථාන, රූපලාවණ්‍යාගාර ආදී සියලු නවීන අංගෝපාංග සහිත පහසුකම් බොහොමයක් සමගින් නගරයේ සුවපහසු ජීවිතය වෙනස්ම අයුරින් අත් විඳින්න.


නිහඬ


අනන්තය


සාද



දරුවන්ට


**අමතන්න 077 0 788 788**

සංවර්ධනය
CAPITOL DEVELOPERS

සැළැස්ම සහ ඉදිකිරීම
Sanken

ගෘහ නිර්මාණ ශිල්පී
P&T GROUP SINGAPORE





Eco Hotel Design in Beragala by C Plus

www.cplusdesign.lk

cplusdesignlk

*Experience unparalleled architectural excellence with our full-service consortium. From homes to hotels, offices to hospitals, we bring your vision to life with timeless elegance and unmatched luxury in every detail.*





Luxury House Design @ Ratnapura by C Plus





Luxury House Design @ Colombo by C Plus

*C Plus Design is an award-winning Architectural firm*

Asia Business Awards 2024
( Best Architect of Sri Lanka )


Luxury Life Style Awards 2022
( Best Luxury Villa Development)

Green Building Awards 2023
( Gold Award )

DFA 2024
(Best Architecture Company)

# ARCHITECTURAL AND INTERIOR DESIGN

**(House Design, Hotel Design, Restaurant Design and any other Building Design)**



*Fashions Store @ Gampaha by C Plus*



*Luxury Hotel Design @ Jaffna by C Plus*

*Hotel Design in Maldives by C Plus*





C Plus Design® (Pvt) Ltd
No. 31/1, Wijerama Lane,
Gangodawila, Nugegoda. 10250

Hotline/WhatsApp:
**0777 333 041**
Telephone:
**0112 804 554**
email:
**info@cplusdesign.lk**

# REAL ESTATE
## CHAPTER 01





# දේපළ වෙළඳාම්

## 01 වන පරිච්ඡේදය

දේපළ වෙළඳාම කියලා කියන්නෙ ව්‍යාපාරික අවස්ථා පුළුල් කර ගන්න වැඩි වශයෙන් මුදල් ආයෝජනය කරන්න හැකි වන අවස්ථාවකට. ඉඩමක්, නිවසක්, වගාවක්, ගොඩනැගිල්ලක් හෝ මිනිස් ඉදිකිරීමක්, අපි දේපළක් විදියට හඳුන්වනවා. සරලවම පැවසුවොත් ඉහත සඳහන් කළ දේවල් මිල දී ගැනීම, කුලියට හෝ බද්දට ලබා දීම තමයි දේපළ වෙළඳාම කියලා හඳුන්වන්නෙ. දේපළ වෙළඳාම කොටස් කිහිපයකින් හඳුන්වා දෙන්න පුළුවන්.

### Residential Real Estate

ඕනිම කෙනෙක්ට ජීවත් වෙන්න නිවසක් අවශ්‍යවෙනවා. ඒක තනි නිවසක් වෙන්න පුළුවන් නැතිනම් මහල් නිවාසයක් වෙන්න පුළුවන්. ඒක ඒ කෙනාගේ ආදායම සහ අවශ්‍යතාවය මත තීරණය වෙනවා. තමන්ට ජීවත් වීමට පහසුව සඳහා ඉදිකෙරෙන දේපළ Residential Real Estate ලෙස හඳුන්වනවා.

### Commercial Real Estate

ව්‍යාපාරික අරමුණක් සඳහා ලබා ගන්නා දේපලක් Commercial Real Estate ලෙස හඳුන්වනවා. යම්කිසි ව්‍යාපායක් සඳහා දේපළක් වෙන්කරවා ගැනීමේදී දරන්න පුළුවන් වියදම පිළිබඳව සැලකිලිමත් වීම වැදගත්. ඒ අනුව එම දේපළ කුලියට, බද්දට හෝ සම්පූර්ණ අයිතියට ගන්නත් පුළුවන්.

### Industrial Real Estate

ව්‍යාපාරයක් සඳහා නිෂ්පාදනාගාරයක් ලබාගැනීම හෝ නිෂ්පාදනාගාර කලාපයක් ලබා ගැනීම Industrial Real Estate ලෙස හඳුන්වනවා. මෙම දේපළ ඉඩම් ලෙසද ලබා ගැනීමට හැකියාව තියෙනවා.

### Land

මෙතනදී මිලදී ගන්නා ඉඩම වගාවක් සහිත ඉඩමක් වෙන්නත් පුළුවන්. නැතිනම් හිස් ඉඩමක් වෙන්නත් පුළුවන්. එහෙමත් නැතිනම් ඛනිජ සම්පත් සහිත ඉඩමක් වෙන්නත් පුළුවන්. මෙම ඉඩම් දේපළ ආයෝජනය විශාල අදායම් ලබා ගැනීමට හැකියාව ඇති ආයෝජන ක්‍රමය වෙනවා.

### Mixed-use properties

අවශ්‍යතාවයක් හෝ අවශ්‍යතාවයන් කිහිපයක් මත මිලදී ගන්නා දේපළ වෙළඳාම් ගනයට මෙය අයත් වෙනවා. එය Commercial Property එකක් වෙන්නත් පුළුවන්. නැතිනම් එතනම ජීවත් වෙන ගමන් එය කුලියට දෙනවා වෙන්නත් පුළුවන්. නැතිනම් අවශ්‍යතාවයන් කිහිපයකට භාවිතා කරනවා වෙන්නත් පුළුවන්. මේ ආකාරයට අවස්ථා ගණනාවකට භාවිතා කළ හැකි දේපළ හඳුන්වන්නේ Mixed-use properties යනුවෙන්.

### Special Purpose Real Estate

විශේෂ අරමුණු සඳහා භාවිතා කරන දේපළ Special Purpose Real Estate යනුවෙන් හඳුන්වනවා. උදාහරණයක් වශයෙන් පෞද්ගලික රෝහල්, අධ්‍යාපන ආයතන මෙම දේපළ වෙළඳාම් ගනයට අයත් වෙනවා.

### Invesment Real Estate

පසුකාලීනව වැඩි ප්‍රතිලාභයක් බලාපොරොත්තුවෙන් දේපළ සඳහා ආයෝජනය කිරීම Invesment Real Estate ලෙස හඳුන්වනවා. මෙම දේපළ නැවත වැඩි මුදලකට විකිණීම හෝ ළඟ තබාගෙන ආදායම් ලබා ගැනීම මෙමඟින් සිදු වෙනවා.

# Real Estate වලින් ලැබෙන ප්‍රතිලාභ

## Residential Real Estate

යම් ආයෝජනයකින් වැඩි ප්‍රතිලාභයක් ලබාගැනීම ඕනෑම පුද්ගලයෙක්ගෙ බලාපොරොත්තුවක්. දේපළ වෙළඳාම කියන්නෙත් ආයෝජනය කරන මුදල් දිනෙන් දින වර්ධනය කරගන්න පුළුවන් කර්මාන්තයක්. සාමාන්‍යයෙන් මාසික ආදායම් මාර්ගයකින් ජීවත් වන කෙනෙකුට ඉතිරි කර ගත් මුදලකින් හෝ ණය මුදලකින් යම්කිසි දේපළක් මිලදී ගන්න පුළුවන්. ඒ හරහා ආදායම් දවසින් දවස වර්ධනය කර ගන්නත් පුළුවන්. උදාහරණයක් විදියට Commercial Property එකක් මිල දී ගන්නවා නම් ඒක කුලියට දෙන්න පුළුවන්. ඒ සඳහා හොඳ අවබෝධයක්, අත්දැකීමක් ගන්න නම් ලංකාවේ විකිණීමට සහ කුලියට ලබා දීමට තියෙන දේපළ වෙළඳාම් සම්බන්ධයෙන් ඇති දැන්වීම් බලන්න. මොකද ලංකාවේ Commercial Property එකක් කුලියට දීමෙන් ලැබෙන ආදායම කියන්නෙ ඒ අදාල හිමිකරුට ලැබෙන Passive income (එක් ආයෝජනයකින් දිගු කාලයක් ආදායම් ලැබීම) එකක්. මොකද ආදායම් උත්පාදනය සහ ආදායම් උපදවීමට ලැබීම කියන අවස්ථා දෙකම හොඳ ආයෝජනයක් කියලා හඳුන්වන්න පුළුවන්.

## Tax Advantage

ලංකාවේ යම් ආදායමක් ලබන ඕනෑම කෙනෙකුට වැඩි වන ආදායමට අනුව ඔහුට හෝ ඇයට ව්‍යාපාරික වශයෙනුත් පුද්ගලික වශයෙනුත් බදු ගෙවන්න සිද්ධ වෙනවා. ඒ ආදායම් බදු වලින් නිදහස් වෙන්න ලැබෙන අවස්ථාවක් විදිහට දේපළ වෙළඳාම් සඳහා ආයෝජනය කිරීම සලකන්න පුළුවන්. එතනදී ආයෝජන වියදමක් දරන නිසාවෙන් එම ආයෝජන වියදම පෙන්නවා සැලකිය යුතු ලෙස බදු වලින් නිදහස් වෙන්න අවස්ථාව ලැබෙනවා.

## Long - Term wealth building

දවසින් දවස ආදායම වැඩි කරගන්න පුළුවන්නම් දිගුකාලීන වශයෙන් ධනය උත්පාදනය කිරීමේ හැකියාව වර්ධනය වෙනවා. උදාහරණයක් විදියට අද මුදලක් ආයෝජනය කළොත් එයින් ලැබෙන ප්‍රතිලාභය ආයෝජන මුදලට වඩා විශාල ගුණයකින් වැඩි වෙනවා. දේපළ වෙළඳාම් වගේම තවත් අංග කිහිපයකින් ම ආදායම් වැඩි කර ගන්න පුළුවන්. මේ වනවිට ඒ සඳහා හොඳ අවස්ථාවන් ලංකාවෙත් ඕනෑ තරම් තියෙනවා. ඒ හරහා ආයෝජන අවස්ථා පුළුල් කරගන්න දැන් අවස්ථා තියෙනවා.

### Inflation Hedge

උද්දමනයෙන් බේරීමට ඇති හොඳ අවස්ථාවක් විදිහට අපිට Inflation Hedge හඳුන්වන්න පුළුවන්. ලංකාවේ රුපියලේ අගය මේ වන විට දිනෙන් දින අඩු වෙමින් පවතිනවා. ඒක නිසා උද්දමනයෙන් බේරීම සඳහාත් උද්දමනයට හසු නොවී මුදල් ඉතා සුරක්ෂිත කර ගන්න තියෙන හොඳම අවස්ථාවක් විදිහට තමයි මේ දේපළ වෙළඳාම් වල මුදල් ආයෝජනය කිරීම හඳුන්වන්නෙ. අපේ රටේ අද රු.1000/- කින් මිලදී ගන්න දේම හෙට වෙනකොට ගන්න රු.1500/- ක් වියදම් කරන්න වෙන්න පුළුවන්. ඒ වුණත් මේ වගේ කාලෙක දේපළ වෙළඳාමක් සඳහා ආයෝජනය කළොත් තව අවුරුද්දකින් ඒ වටිනාකම උද්දමනයට වඩා වැඩි වේගයකින් වර්ධනය වෙලා තියේවි. එම නිසා මුදල්, මුදල් විදියටම ළඟ තියා ගන්නෙ නැතුව වැඩි ප්‍රතිලාභයක් ලබාගන්න පුළුවන් අවස්ථාවක් ලෙස දේපළ වෙළඳාම් සඳහා ආයයෝජනය කිරීම සලකන්න පුළුවන්.

## Portfolio Diversification


එක ආදායම් මාර්ගයක් අවහිර වුණොත් ඒ වෙනුවට තවත් ආදායම් මාර්ග රැසක් හඳුනාගන්න පුළුවන් අවස්ථා දේපළ වෙළඳාම් තුල පවතිනවා. ඒ කියන්නේ දැනටමත් ලැබෙන ආදායම් මාර්ග වලින් ලැබෙන ආදායම භාවිතා කරල විවිධාංගීකරණය (Diversification) කරන්න පුළුවන් ආදායම් උත්පාදනය වන ආකාරයට. ව්‍යාපාරිකයෙකුට ලැබෙන ආදායමේ ලාභයෙන් දේපළ වෙළඳාමක් සඳහා බය නැතුව ආයෝජනය කරන්න පුළුවන්. මොකද ලංකාව තුලත් මේ වන විට ලාභ ලබන්න පුළුවන් හොඳම ආයෝජන අවස්ථාවක් විදියට දේපළ වෙළඳාම් සැලකෙනවා. ඒ හරහා ලැබෙන ආදයම තවත් ව්‍යාපාරයක් සඳහා ආයෝජනය කිරීමේ අවස්ථාවද හිමි වෙනවා. උදාහරණයක් විදිහට ඇඟලුම් කර්මාන්ත ආශ්‍රිත නිශ්පාදන කරන කෙනෙක්ට ලැබෙන ලාභයෙන් ආදායම් ලබන්න පුළුවන් තේ, රබර්, පොල් වැනි වගා බිමක් මිලදී ගන්න පුළුවන්. එහෙම නැතිනම් Commercial Property එකක් ගන්නත් පුළුවන්. ඒවායින් ලැබෙන ආදායම් දවසින් දවස උත්පාදනය කරගන්න පුළුවන්. කිසිම වගාවක් නොකෙරූ ඉඩමක් මිල දී ගත් කෙනෙකුට එම ඉඩම දියුණු කරලා නැවත කැබිලි කරලා විකුණන්න පුළුවන්. ඒ හරහා ලැබෙන ආදායමෙන් වෙනත් ආයෝජනයක් කිරීමට ද අවස්ථව තියෙනවා.

දේපළ වෙළඳාම් වල මුදල් ආයෝජනය කරලා මේ වගේ තවත් ප්‍රතිලාභ රැසක් ලබා ගන්න පුළුවන්. මේ වන විට දේපළ වෙළඳාම් කියන සංකල්පය ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයන් අතර ප්‍රවණතාවයක් වෙලා තියෙනවා. ඒ නිසාම ඒ පිළිබඳව විස්තර සොයා දැනගන්න බොහෝ දෙනෙක් පෙළඹෙනවා. මේ වනවිටත් ලංකාව තුල දේපළ වෙළඳාම් ආයතන සැලකිය යුතු ප්‍රමාණයක් තියෙනවා. ඒ ඒ ආයතන වලට අදාල වෙබ් අඩවි හරහා ඕනෑම කෙනෙක්ට ඒවායෙහි මිල ගණන් වගේ විස්තර දැනගන්න අවස්ථාව තියෙනවා.



එච්.ඩී. සලනි නිසන්සලා පද්මසිරි
B.Sc.Business Administration(General)Degree





# RALIABLE AND ECO-FRIENDLY SCIENTIFIC GEM MINERS



## CEYLON SAPPHIRE MINING PVT LTD


+94 45 313 60 90
+94 77 726 52 30
+94 76 385 13 91

ceylonsapphiremining@gmail.com

Clarandan Estate, Hidellana,
Ratnapura, Sri Lanka










# SLTC සමඟින් අනාගතයට පියනගමු!



උසස් අධ්‍යාපනයේ නිම් වළලු පුළුල් කරමින් ඔබ කැමති ක්ෂේත්‍රයකින් අනාගතය හැඩකර ගන්න

**පරිගණක හා තොරතුරු තාක්ෂණ පීඨය**
Faculty of Computing and IT

**විද්‍යා පීඨය**
Faculty of Science

**ඉංජිනේරු පීඨය**
Faculty of Engineering

**තාක්ෂණ පීඨය**
Faculty of Technology

**ව්‍යාපාර කළමනාකරණ පීඨය**
Faculty of Business Management

**පශ්චාත් උපාධි අධ්‍යයන සහ පර්යේෂණ පීඨය**
Faculty of Postgraduate Studies and Research

CALL FOR MORE INFORMATION
0117 999 000


***Enrol Today!***

SLTC
Research University




# සංචාරකයින්ට මඟහැරෙන හක්ගල දැඩි රක්ෂිතය





නුවරඑළිය ප්‍රදේශයේ ඇති සුන්දරත්වය සහ දේශගුණික ස්වභාවය නිසා බොහෝ දෙනෙක් විනෝද චාරිකා සඳහා නුවරඑළිය තෝරා ගනී. එහිදී බොහෝ දෙනෙක් හක්ගල උද්භිද උද්‍යානය නරඹන්නට ගියද හක්ගල කන්ද මැගහැරෙන්නට හේතුව එහි වටිනාකම නොදන්නාකමත් එය දැඩි රක්ෂිතයක් වීම නිසා ඊට ඇතුල්වීමට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අවසරයක් අවශ්‍ය වීමත් බලපානු ඇත.




හක්ගල කඳුවැටිය නුවරඑළිය - බදුල්ල පාරේ 15km ක් පමණ දුරකින් කටුමාන සහ සීතාඑළිය පසුකළ විට නුවරඑළිය නගරයට ගිනිකොන දෙසින් පිහිටා ඇත. අඳුරු වනාන්තරයකින් යුක්ත මෙම හක්ගල කඳුවැටිය නුවරඑළිය, අඹේවෙල වැනි ප්‍රදේශයන්හි තේ වතුවලට ඉහළින් අලංකාරව දිස්වේ. විවිධ දිශාවන්ට විවිධාකාරව දිස්වන මෙහි කඳුමුදුන් තුනක් එක පෙළට පිහිටා තිබීමෙන් අනෙක් කඳු අතරින් එය වෙන්කර හඳුනාගැනීම පහසු වේ.

වර්ෂ 1938 පෙබරවාරි මස 25 වෙනිදා හක්ගල කන්ද දැඩි රක්ෂිතයක් ලෙස නම් කෙරුණු අතර ඊට අයත් භූමි ප්‍රදේශය අක්කර 2885ක් පමණ වේ. එයින් අක්කර 1142ක් නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්කවලට අයත් වේ.

හක්ගල කඳුවැටිය දැඩි ස්වභාව රක්ෂිත තුනෙන් කුඩාම රක්ෂිතය වුවද ජෛව විවිධත්වයෙන් ඉහළම තැන හිමිකරගනී. එමෙන්ම එය මුහුදු මට්ටමේ සිට මීටර් 1650-2178 ත් අතර උසකින් පිහිටා ඇති අතර වනය ව්‍යාප්ත භූමි ප්‍රදේශයෙන් වර්ග සැතපුම් 35කට ආසන්න ප්‍රමාණයක් හක්ගල කඳුවැටියට අයත් වේ. හක්ගල හැරුණු කොට ශ්‍රී ලංකාවේ පිහිටා ඇති අනෙකුත් දැඩි ස්වභාව රක්ෂිත ලෙස වර්ෂ 1938.03.01 වන දින ප්‍රකාශිත යාල දැඩි ස්වභාව රක්ෂිතය සහ 1941.11.07 ප්‍රකාශයට පත් කළ රිටිගල දැඩි ස්වභාව රක්ෂිතය හැඳින්විය හැකිය.








ඉතා සුළු වශයෙන් ශ්‍රී ලංකාව තුළ පවතින කඳුකර වැසි වනාන්තරයන්ගෙන් එක් වනාන්තරයක් හක්ගල දී දැකගත හැකිය. එහි වර්ෂාපතනය 2400mm කට වඩා වැඩි අගයක් ගනී. එමෙන්ම එහි වෘක්ෂයන් උසින් අඩු කුරු ස්වභාවයක් ගන්නා අතර ඒවායෙහි සාමාන්‍ය උස මීටර් 3-4ත් අතර වේ.

එහි ඇති ශාක විශේෂයන් ලෙස වල් කුරුඳු, සීතා ජේර, වැල් කපුරු, මහමීමන, නෙලු, කීන, පොල්කටු වැනි ශාක හැඳින්විය හැක. එමෙන්ම එහි ජීවත්වන සත්ත්ව විශේෂයන් අතර කොටියා, කඳුකර කළු වඳුරා, ගෝනා, බළල් දිවියා, වල් වඳුරා, අං කටුස්සා, හාවා, දඬුලේනා, කඳුකර ලේනා යන සත්ත්වයින් විශේෂ තැනක් ගනී. එපමණක් ද නොව ඒ පරිසරයට ආවේනික වූ පක්ෂීන් අතර අරංගයා, පීතකන් කොණ්ඩයා, කඳුකර නිල් මැසිමාරාවා සහ ලංකා මල් කුරුල්ලා දැකගත හැකිය.

නමුත් මේ කඳුකරයේ සර්පයින් දැකගත හැක්කේ ඉතාම අඩු වශයෙනි. ඒ අතරිනුත් දළ මැඩිල්ලාට විශේෂ තැනක් හිමි වේ. මෙහි ජීවත්වන උභය ජීවී විශේෂයන්ගෙන් 57%ක් ශ්‍රී ලංකාවේ පමණක් දැකගත හැකිවීම විශේෂත්වයකි. එමෙන්ම මෙහි වෙසෙන පක්ෂීන්ගෙන් 17%ක් ද ක්ෂීරපායීන්ගෙන් 32%ක් ද සමනළ විශේෂ වලින් 26% ක් ද ඒ ආවේනික ගොන්නට අයත් වේ.



## THISSA GEMS

Buyer & Exporter of Gems



**Ratnapura**

No. 45, Isuru Place,
Paradise, Kuruwita,
Ratnapura,
Sri Lanka.

| | |
|---|---|
| Tel : | 045 22 622 82 |
| | 077 77 156 99 |
| | 071 47 221 64 |
| Fax : | 045 22 637 75 |

www.tissagems.com
Email : tissagems.pvt.ltd@gmail.com

**S.A. TISSA JAYAWARDENA**
*Proprietor*



**Colombo**

No. 441 4/1,
Galle Road,
Colombo 03,

Tel : 0112 370 171
0112 555 730
Fax : 0112 555 731





## මනසට සැහැල්ලුව ගෙන දෙන..
## නිවසට, කාර්යාලයට ලස්සන ගෙන දෙන..

# INTERIOR DESIGN

බොහෝ දෙනෙක් Interior design කියලා කිව්වහම එකපාරම හිතන්නේ වාස් එකක් තියන එක ගැන, නැත්තම් වාස් එකට මල් දාල තියන එක ගැන, Curtain දාන එක ගැන, එහෙමත් නැත්තම් ගෘහ භාණ්ඩ ගැන විතරයි. ඒත් මේ දේවල් Interior design වල එක කොටසක් විතරයි. ඇත්තටම Interior design කියලා කියන්නෙ Architectural Plan එකේ ඉදලා ඒ නිර්මාණයේ අවසානය දක්වාම වැදගත් වන දෙයකට. නමුත් ලංකාවේ බොහෝ දෙනෙක් කරන්නේ ගොඩනැගිල්ල හදලා ඉවර වුණහට පස්සේ Interior design එක ගැන හිතන එක. ඒකෙන් වෙන්නෙ ඒ නිර්මාණයට සාර්ථක නිමාවක් නොලැබෙන එක. උදාහරණයක් විදිහට අපිට Plug point එන තැන් ආයෙත් කඩලා හදන්න වෙන්න පුළුවන්. ඒ වගේ තව ගොඩක් දේවල් වෙනස් කරන්න වෙන අවස්ථා ඕනෑතරම් තියෙනවා. ඒක නිසා Interior design කෙනෙක්ව මුල ඉදලම තමන්ගෙ නිර්මාණයට සම්බන්ධ කරගන්න එක ගොඩක් වැදගත් වෙනවා.

## Space planing

Space planing වලදි කරන්නෙ ගෘහ භාණ්ඩ සහ ඒ අවකාශයට අදාල උපකරණ අවශ්‍ය පරිදි ස්ථානගත කරන එක සහ කලමනාකරණය කරන එක. සමහර අවස්ථා වලදී පාරිභෝගිකයාගේ අවශ්‍යතාවයන් වලට ඒ ඉඩකඩ මදි වෙන්න පුළුවන්. එහෙමත් නැත්තම් ඕනෑවට වඩා වැඩි වෙන්නත් පුළුවන්. එහෙම වුණහම අවශ්‍ය විදියට හිස්බව වැඩි කරලා පේන්න පුළුවන්. ඒ දේවල් මඟහරවා ගන්න තියන හොඳම විසදුම තමයි Architectural Plan එක වෙන තැන ඉදලම Interior design කෙනෙක්ව සම්බන්ධ කර ගන්න එක.

## Colours & Sizes

Interior design එකකට යොදා ගන්නා වර්ණ ගැන නිර්ණය කරද්දි සැලකිලිමත් විය යුතුම දේවල් ටිකක් තියෙනවා. මොකද සමහර අය වැඩිය හිතන්නෙ නැතුව බිත්ති සඳහා අඳුරු වර්ණ හෝ තද වර්ණ තෝරාගන්නවා. නමුත් ඒකෙන් වෙන්නෙ තියෙන ඉඩකඩත් තව අඩු කරලා පෙන්වන එක. ඒ වගේම තමයි ඒ සඳහා භාවිතා කරන ගෘහ භාණ්ඩ වල වර්ණය සහ ප්‍රමාණයත් පොළොව සඳහා භාවිතා කරන Tyle වල වර්ණ සහ ප්‍රමාණයත් වගේම තිර රෙදි සඳහා භාවිතා කරන වර්ණ සහ ප්‍රමාණය (උස සහ ඝනකම නැතිනම් විනිවිද පෙනෙන සහ නොපෙනෙන ස්වභාවය) අනිවාර්යයෙන්ම ඉඩකඩ අඩුවැඩි කරලා පෙන්වන්න බලපානවා. ඒක නිසා වර්ණ ගැලපීම සහ අවශ්‍ය අනෙකුත් භාණ්ඩ සහ ද්‍රව්‍යයන් තෝරාගැනීම ඉතා පරිස්සමෙන් කළ යුතු දෙයක් වෙනවා.

ප්‍රදීපා ජයසූරිය

# ජල රෝපිත වගාව (Hydroponics)

නාගරික ප්‍රදේශවල ජීවත් වන බොහෝ දෙනාට පවතින ඉතා අඩු ඉඩකඩ තුළ ගෙවත්තක් පවත්වාගෙන යාමට ආසාවක් දැක්වුවත් පස්, හිරු එළිය, අඩු ඉඩ වැනි හේතූන් නිසා වගාවෙන් ඈත් වී තිබෙන ඔබට ඉඩකඩ කාර්යක්ෂමව භාවත කරමින් ගෙදරට අවශ්‍ය බෝග වගා කිරීමට පස භාවිත නොකර සිදු කළ හැකි වගා ක්‍රමයක් ලෙස මෙය හඳුන්වන්න පුළුවන්. එවිට ඔබේ තට්ටු නිවසේ නම් බැල්කනිය, නිවස ඉදිරිපස, පිටුපස හා නිවසේ ආලින්දය වැනි ස්ථානවලද මෙලෙස Hydroponics ක්‍රමයට වගාකටයුතු කළ හැක.

ශාක පෝෂක අඩංගු ජලීය මාධ්‍යක් භාවිත කරමින් ශාක පෝෂණය සිදු කරමින් මෙම වගාව කිරීම ජලරෝපිත හෙවත් Hydroponics ලෙස හඳුන්වයි.

නිවසේ ඇතුළත වුවද වගාකළ හැකි ක්‍රමයක්වන අතර මෙමඟින් බෝග වර්ධනය සීමාකාරී වන අවස්ථාවන්හි දී මෙන්ම පසෙහි වගා කිරීමේ දී මතුවන විවිධ සීමාකාරී සාධක මඟහැරවීම සඳහාද භාවිත කළ හැකි වේ.
මේ සඳහා සැප්‍රෝෆෝම් බඳුන් මෙන්ම සිමෙන්ති බඳුන් ද ප්ලාස්ටික් බඳුන් ද භාවිත කළ හැකි වුවත් පහසුවෙන් හා ලාභදායීව ලබා ගතහැකි සැප්‍රෝෆෝම් බඳුන් මේ සඳහා වඩාත් සුදුසු වේ. ඕනෑම ප්‍රමාණයෙන් බඳුනක අලබෝග හැර ඕනෑම බෝගයක් ඉතා පහසුවෙන් පස් නොමැතිව වගා කළ හැකි ක්‍රමයකි.

අවශ්‍යතාවයට/ බෝගය අනුව සැප්‍රෝෆෝම් පෙට්ටියක් ගෙන එහි ඇතුළත ඝනකම කළු පොලිතීන් එකකින් ආවරණය කරන්න. (ගේජ් 150) එහි දී පොලිතීනය ඇලවීමට ගම්ටේප් භාවිත කළ හැක. පැළ සිටුවීම සඳහා ඉවතලන ප්ලාස්ටික් කෝප්ප හෝ වෙළඳපළේ පහසුවෙන් අඩු මුදලකට ලබා ගත හැකි බීම කප් යොදාගත හැකිය. නැතිනම් නිවසේ ඉවතලන මෙගාබීම බෝතල් වලින් ද අඩක් කපා භාවිත කළ හැක. සැප්‍රෝෆෝම් පෙට්ටියේ පියනෙහි සමාන පරතර ඇතිව පැළ සිටු වීමට යොදා ගන්නා බඳුන්/ කප් රැදවීමට අවශ්‍ය ප්‍රමාණයට සිදුරු සකස්_කර ගන්න. ප්ලාස්ටික් කෝප්ප වල පතුලේ හා වටේ බිත්ති වල 5mm පමණ වන සිදුරු සකස් කර ගන්න. ජලීය මධ්‍යයේ පෝෂක උරා ගැනීමට මෙන්ම පැළ වල මූල මණ්ඩලයෙහි වර්ධනය සඳහා එය අවශ්‍ය වේ. එම ප්ලාස්ටික් කෝප්ප වලට සිදුරු සහිත දැල් රදවා ඒ තුළට වගා මාධ්‍ය පුරවා (කර දහයියා/ කොහුබත්) පැළ සිටුවීම කළ හැක. ( ජලීය මාධ්‍ය තුළ වගා මාධ්‍ය දියවීම වැළකීමට කුඩා දැල් කැබැල්ල යොදා ගනී) ජලීය පෝෂක මාධ්‍ය සකස් කර ගැනීම සඳහා ඔබට වෙළඳපළින් ඇලබට් පොහොර (Albert solution) මිල දී ගත හැක. එමඟින් සැප්‍රොෆොම් පෙට්ටිය ජලීය පෝෂක මාධ්‍යයෙවන් පුරවා ජලීය මාධ්‍යයේ යන්තම් ගෑවෙන මට්ටමට සිටින සේ වගා බඳුන් සහිතව පියන වැසිය යුතුයි. වරින්වර ද්‍රාවණ මට්ටම පරීක්ෂා කිරීම හා මසකින් ද්‍රාවණය මාරු කිරීම කළ යුතුය. මෙලෙස ජල රෝපිත තාක්ෂණය භාවිතයෙන් වගා කිරීම මඟින් නිවසට අලංකාරයක් මෙන්ම නිවැසියන්ගේ පෝෂණයට අවශ්‍ය නැවුම් ආහාර නෙලා ගැනීමට හැකියාව ලැබේ.







ඩබ්. අර්සලා නිලක්ශි
Agriculture instructor
Department of Agriculture

# NITCO INFINITY

## MINIMALIST THEME

*Interiors Design*

ඔබේ නිවසේ,කාර්යාලයේ
අවකාශය පරිපූර්ණත්වයට
පත් කර ලන්නට..

Nitco Infinity (Pvt) Ltd
Transforming Spaces into Perfection

**070 702 2222**

**www.nitcoinfinity.com**

SHOWROOM
011 282 2969
info@nitcoinfinity.com
No. 262, High Level Road,
Nugegoda, Sri Lanka.

FACTORY
011 275 5832
info@nitcoinfinity.com
No. 250/A/21, Pitipana South,
Galagahena, Kiriwaththuduwa,
Homagama, Sri Lanka.






RELAXING
BEDROOM
INTERIOR



PROFESSIONAL
COMMERCIAL
INTERIOR



PREMIUM QUALITY
WORDROBES

# MM GEMS

MAHATHUN MALLEE
*gems*

DAYARATHNA DISSANAYAKE
Proprietary

KALAWANA ROAD, NIVITHIGALA
071 2716560, 077 3333850, 071 2737017
Home - 045 2279527, 045 2228791
Office - 045 2279260






# සොල්දාදුවෙක් මරණය අභියස සොයාගත් Coca-Cola



1831 වර්ෂයේ ඇමරිකාවෙහි Knoxville නම් කුඩා ගම්මානයක උපත ලබන ජෝන් හැදී වැඩෙන්නේ ජෝර්ජියාවේ රෝම් නගරයේය. වයස අවුරුදු 19 පිරෙද්දී ම ඔහුට තොම්සෝනියානු වෛද්‍ය විද්‍යාව (Thomsonian medicine) හැදෑරීමට අවස්ථාව උදාවේ. තොම්සෝනියානු වෛද්‍ය විද්‍යාවේ මූලික අන්තර්ගතය වන්නේ උද්භිත විද්‍යාව සහ ශාක සාරයන්හි මූලධර්මයන් යොදාගනිමින් ශරීරයෙහි විෂ ද්‍රව්‍ය ඉවත් කිරීම සඳහා කරනු ලබන ප්‍රතිකාර හඳුනාගැනීමයි. අතීතයේ දී මෙම වෛද්‍ය ක්‍රමයට එතරම් පිළිගැනීමක් නොලැබුණු අතර බොහෝ දෙනෙක් මෙම තොම්සෝනියානු වෛද්‍ය ප්‍රතිකාර පිළිබඳව සැක පහල කරන්නට විය.

නමුත් ඒ පිළබඳව කිසිදු නැකීමක් හෝ කනස්සල්ලටපත් නොවුනු ජෝන් මෙම වෛද්‍ය ප්‍රතිකාර සඳහා භාවිත කරන ඖෂධ වර්ග මූලිකකොටගෙන නව ව්‍යාපාරයක් ද ආරම්භ කලේය. මේ කාලය අතරතුර දී ඖෂධ වේදය පිළිබඳව උපාධියක් ද ලබා ගැනීමට ජෝන්ට අවස්ථාව උදාවුණු නමුත් උපාධිය අවසාන වනවාත් සමඟ ම ඔහුට ඖෂධවේදී වෘත්තිය අතහැර ඇමරිකානු හමුදාවට බැදෙන්නට සිදුවිය.

සිවිල් යුද්ධය දරුණුව පැවතිය ද ලුතිනන්වරයෙක් ලෙස හමුදාවෙහි සේවයට බැඳුණු ජොන් වසර 3ක කාලයක් පුරාම ඉදිරිපෙළ සටන් මෙහෙයුම් සඳහා සහභාගී වී ඇත. එහි දී කඩු ප්‍රහාරයකට ලක්වෙන ජෝන්ට මරණීය තුවාල පවා එල්ල වී තිබූ නිසාවෙන් ඔහු වැඩි වේලාවක් ජීවත් නොවුනු ඇතයි වෛද්‍යවරුන්ගේ නිරණය විය. වෛද්‍යවරුන්ගේ එම තීරණයත් සමඟ අඩුතරමින් ඔහුගේ වේදනාවන් හෝ සමනය කරන්නට මෝර්ෆින් (Morphine) ලබා දෙන්නට තීරණය කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස කිසිවෙක් නොසිතූ අන්දමින් ඉතාමත් ආශ්චර්යමත් ලෙස ඔහුගේ ජීවිතය සුරැකුනු අතරම කාලයක් ගතවෙන් ම ඔහු යථාතත්ත්වයටම පත්විය.

ඒත් සමඟ ම හමුදා ජීවිතයට සමුදෙන ජෝන්ට වඩාත් යහපත් සාර්ථක ජීවිතයක අත්‍යවශ්‍යතාවය දැනෙන්නට විය. එනිසාම ඔහු සිය පවුලේ සාමාජිකයන් සමඟ ඇට්ලාන්ටා (ATLANTA) නගරයෙහි පදිංචියට ගොස් එහි ස්ථාපිත ඖෂධ සමාගමක රැකියාවකට ගොස් ඇත. ජොන්ගේ පැමිණීමත් සමඟ ම ඒම ඖෂධ සමාගම වඩ වඩාත් ප්‍රසිද්ධියට පත්විය. ඇට්ලාන්ටා නගරයේ ජනප්‍රියතම කායිකරෝග වෛද්‍යවරයා ලෙස නාගරවාසීන් පසු කාලීනව ජෝන්ව හඳුන්වන්ට ද විය.

කෙසේ නමුත් ඒවන විටත් ජෝන් ඉතා අවාසනාවන්ත ලෙස මෝර්ෆින් වලට ඇබ්බැහි වී සිට ඇත. මෝර්ෆින් වලට ඇති ඇබ්බැහි වීමෙන් මිදීම සඳහා ඔහු විසින් ම විවිධ ශාක ඖෂධ වර්ග යොදා ගනිමින් විවිධ පරීක්ෂණ ද සිදු කර ඇත.

එම පානයේ අන්තර්ගතයට කොකා කොළ සහ රතු වයින් අඩංගු වන බවත් එමගින් ඕනෑම රෝගයක් සුවා කර හැකි බවත් සඳහන් වේ. මෙම පානයේ යම් යම් වෙනස්කම් කිහිපයක් සිදු කර එය තමාට මෝර්ෆින් ඇබ්බැහි වීම මිදීමට භාවිත කළ හැකි බව ජෝන්ට කල්පනා විය.

ඉන් පසුව ඔහු කොකා කොළ, රතු වයින් සහ සහ කෝලා ඇට භාවිත කරමින් "PEMBERTAN FRENCH WINE COCA" නමින් පානයක් නිෂ්පාදනය කලේය. මෙහි අඩංගු කොකා කොළ කුසගින්න, පිපාසය, තෙහෙට්ටුව සහ වේදනාව මර්ධනය කිරීමේ උත්තේජනයක් ලෙස ක්‍රියා කරන අතරම මෙම එක් කොකා කොළයක 0.35% ක ප්‍රමාණයක කොකේන් අන්තර්ගත වේ. ඇමරිකාව තුළ කොකා ගස් ඉතා බහුලව දක්නට ඇති නිසාම එම පානයෙහි නිෂ්පාදන කටයුතු සිදු කිරීම එතරම් අපහසු වී නැත.

එමෙන් ම එවකට සිටි සමහර වෛද්‍යවරුන් සහ ඖෂධ වේදීන් මෙම පානය මෝෆින් ඇබ්බැහි වීමෙන් මිදීම සඳහා භාවිත කළ හැකි සහ ඊට සුදුසු පානයක් බවත් නිර්දේශ කර ඇත. ඒත් සමඟ ම මෙහි අඩංගු කෝලා ඇට වල කැෆේන් බහුල වශයෙන් අන්තර්ගත වන අතර ම එය ආහාර ජීර්ණය පහසු කරවන්නක් බවද සොයාගෙන ඇත. මෙම නවතම පානය භාවිත කිරීම මඟින් ඇබ්බැහි වීම (Addictions) , මානසික අවපීඩනය (Dippretion) , කාන්සාව සහ හිසරදය වැනි තවත් රෝග ගණනාවකට ම විසඳුම් ලැබෙන බව ජෝන් පවසා ඇත.

මෙම සොයාගැනීමෙන් අනතුරුව ඔහු සිය විද්‍යාගාරයේ දී ම මෙම පානය නිෂ්පාදනය කරමින් ඒවා හමුදා නිලධාරීන් වෙත. බෙදාහැර ඇති අතර ඒ සඳහා ඔහු බෙදාහැරීම් ජාලාවක් ද ආරම්භ කර ඇත. එපමණක් ද නොව හවුල්කරුවන්ට සහ කොන්ත්‍රාත්කරුවන්ට රිසි පරිදි ඒවා විකිණීමටත් ඔහු අවස්ථාව සලසා දී ඇත.

පසුකාලීනව බොහෝදෙනා අතර මෙම පානය ඉතාමත් ජනප්‍රිය වූ නමුත් ව්‍යාපාරයක් පවත්වාගෙන යාමට ඉල්ලුම් පමණක් ප්‍රමාණවත් නොවීම එක්තරා ගැටළුවක් ව පැවතිනි. ඒ සඳහා ජෝන්ට සිය ව්‍යාපාරය පුළුල් කිරීමට අවස්ථාවක් උදාවූ අතරම එය මේවනවිටත් ජනප්‍රියව පවතින COCACOLA පානයේ ආරම්භයයි.

1885 වසරේ දී "PEMBERTAN FRENCH WINE COCA" නමින් මෙම පානය වෙළඳපළට හඳුන්වා දී ඇත. ඇට්ලාන්ටාව එවකට ඇමරිකාවෙහි අනෙකුත් රාජ්‍යයන් සමඟ එක්ව මත්පැන් තහනම් කිරීමට තිරනය කර සිට ඇත. එයින් බියට පත්වන ජෝන් මෙම පානයෙහි අන්තර්ගතය තුළ ඇති වයින් වෙනුවට නව







සංයෝගයක් භාවිත කළ යුතු බවට වටහාගෙන ඇත. මෙම පානය නිෂ්පාදනය කිරීමේ දී වයින් භාවිත නොකිරීමෙන් "Cola"ඇට වල අඩංගු අදික තිත්ත රස වඩාත් ඉස්මතු වී ඇත. ඒ නිසාවෙන් ම වයින් වෙනුවට කෘතිම කැෆේන්,සීනි, සිට්‍රික් අම්ලය, වැනිලා, ලෙමන් තෙල්, දොඩං, සාදික්කා සහ කොත්තමල්ලි යොදාගත් අතරම එහි නිෂ්පාදන නාමය **"COCACOLA"** ලෙස වෙනස් කරන්නැයි **FRANK ROBINSON** විසින් යෝජනා කර ඇත. එමෙන් ම "COCA – KOLA" යන වචනයෙහි එන K අක්ෂරය C ලෙස භාවිත කිරීම (COCA-COLA) වඩාත් ආකර්ෂණීය බවක් ගෙන දෙනු ඇතයි ෆ්රැන්ක් තවදුරටත් පවසා ඇත. ඔහුගේ උපදෙස්මත ජෝන් "COCA-COLA" නම් නව වෙළඳ සන්නාමයක් යටතේ නව පානයක් ලොවට හඳුන්වා දුන් නමුත් වසරක් ගතවනවාත් සමඟ ම සැලකිය යුතු මට්ටමකින් ඉල්ලුම් පහළ බසින්නට පටන්ගෙන ඇත. ජෝන් මෙම අවස්ථාව අසාර්ථක ප්‍රයත්නයක් ලෙස දුටුව ද ෆ්රැන්ක් එහිදී මෙසේ පවසා ඇත්තේ ඉතා සුභවාදී අදහස් ඇත්තෙකු ලෙසෙනි. ''ව්‍යාපාරය අලුත් නිසා එවැනි පාඩුවක් සිද්ධ වීම සාමාන්‍ය දෙයක් " ඔහුගේ එම සුභවාදී අදහසට අනුව COCA-COLA සමාගම පසුව බැනර්, රථවාහන, පුවරු වෙළඳසැල් ඉදිරිපිට ප්‍රචාරක දැන්වීම් පළ කරන්නට කටයුතු කර ඇත. වාසනාවකට මෙන් එම ප්‍රයත්නය සාර්ථක වී ඇත. ඇට්ලාන්ටාව පුරාම COCA-COLA පානය අතිශය ජනප්‍රිය පානයක් බවට පත් වන්නට පටන්ගෙන ඇත. ජෝන් සහ ෆ්රැන්ක්ගේ මෙම සාර්ථකත්වය අභියෝගයන්ට මුහුණ දෙමින් ව්‍යාපාරයක් ගොඩනන්වන ආකාරයත් පෙන්වා දෙන්නට කදිම නිදසුනකි.

"COCA-COLA" වලට ඇති ඉල්ලුම ක්‍රමක්‍රමයෙන් ඉහළ ගිය ද දෛවයේ සරදමක් ලෙස ජෝන්ගේ සෞඛ්‍ය තත්ත්වය දිනෙන් දින පිරිහෙමින් පැවතුනි. ඔහුට අමාශගත පිළිකාවක් වැළදී ඇති බව දැනගන්නට ලැබුණු අතරම එහි වේදනාව සමනය කර ගැනීමට ඔහු නැවතත් මෝර්ෆින් භාවිත කරන්නට යොමු වී ඇත.


තමාගේ පවුලේ සාමාජිකයින් වෙනුවෙන් යම්කිසි මුදලක් ඉතිරි කිරීමටත් මොර්ෆින් වලට ඇබ්බැහි වීමෙන් සිදුවන ආර්ථික පරිහානිය වලකා ගැනීමටත් අවශ්‍ය වූ නිසාම ජෝන් පසුකාලීනව ඔහුගේ ව්‍යාපාරයන් කොටස් වශයෙන් විකිණීමට-


මෙම කාලයේ දී "VIN MARIANI" නම් ප්‍රංශ පානයක් පිළිබඳව ඔහුට අසන්නට ලැබී ඇත. තීරණය කළද අනාගතයේ යම්කිසි දවසක COCA-COLA පානය මුළුමහත් ලෝකයේම අතිශය ජනප්‍රිය පානයක් වනු ඇතැයි සිහින දකින ජෝන් සිය ව්‍යාපාරයෙන් 1/3 ක අයිතියක් ඔහුගේ පුත් **"CHARLES REMFERTON"** වෙත පවරා ඇති අතර ඔහු COCA-COLA නිෂ්පාදන ක්‍රියාවලියේ ප්‍රධානියා ලෙස ක්‍රියා කර ඇත. නමුත් පසුකලක ඔහුත් මෝර්ෆින් වලට ඇබ්බැහි විය. ඒ කාලය වන විට ජෝන් රෝගාතුරව ඇඳට වී සිටි නිසා COCA-COLA පිළිබඳව වූ දර්ශනය ඉදිරියට රැගෙන යාමට කිසිවෙකුට නොහැකිවේ යැයි බියෙන් පසුවන ෆ්රැන්ක් ඒ සඳහා ආයෝජකයෙකු සොයා ගැනීමට උත්සාහ කළේය. ඒ සඳහා ෆ්රැන්ක්ට ඉතා ධනවත් මෙන් ම උද්යෝගිමත් ව්‍යාපාරිකයෙක් සොයාගන්නට හැකි විය. ඔහු නමින් "ඒසා කැන්ඩ්ලර්". නමුත් ඔහු තුළ COCA-COLA ව්‍යාපාරය පිළිබඳව එතරම් පැහැදීමක් නොවීය.

එක් දිනක් ෆ්රැන්ක් සහ ඒසා වීදියේ ගමන් කරමින් සිටි අතර ෆ්රැන්ක් ඒසාට මෙසේ පවසා ඇත. **"ඔබට පෙනෙනවද අර හිස් බියර් බැරල් කරත්තේ, අපි කොහොමහරි උත්සහ කරන්න ඕනි COCA-COLA වලටත් ඒ වගේ ජනප්‍රියත්වයක් ගේන්න."** මේ කතාබහ අවසානයේ COCA-COLA සමාගමේ දැක්ම ඉදිරියට රැගෙන යාමට ඒසා කෙසේ හෝ එකඟ වූ බව කියවේ. ඔහු COCA-COLA නාමය සහ රහස් වට්ටෝරුව මිලට ගත් අතර ෆ්රැන්ක් පැවසූ අන්දමින් ම COCA-COLA සමාගම නැවත ගොඩනන්වාලීමට ද ඔහුට හැකි වී ඇත. ඔසුසල් සහ සිල්ලර වෙළඳසැල් වලට පමණක් නොව FOUNTAIN බීමහල් සඳහා ද පසු කලෙක දී COCA-COLA පානය හඳුන්වා දී ඇත. මෙහි දී පාරිභෝගිකයන් ට නොමිලේ COCA-COLA බීම වීදුරුවක් පානය කිරීම සඳහා කූපන් පතක් ද බෙදා හැරීමට ද ඔවුන් කටයුතු කර ඇත. මෙය වෙළඳ සමාගමක් විසින් කූපන් පතක් බෙදා හැරිය ප්‍රථම අවස්ථාව ලෙස ඉතිහාසයට එක් විය.

සියලු කටයුතු මෙසේ සාර්ථකව සිදු වෙමින් COCA-COLA සමාගම ඉදිරියට ගියද කණගාටුවට කරුණ වූයේ සිය ව්‍යාපාරයේ සාර්ථකත්වය දැක ගැනීමට සිහින දකිමින් සිටි ජෝන්ට එය සම්පූර්ණයෙන් ම දැක ගැනීමට නොලැබීමයි.

ඒසා COCA-COLA සමාගම මිලදී ගෙන වසර දෙකක් ගතවනවාත් සමඟ ම ජෝන් මිය ගියේය. ඒ මොර්ෆින් වලට ඇබ්බැහි වුණු දුප්පතෙකු ලෙසයි. එමෙන් ම මෝර්ෆින් වලට තිබූ වාල්ස්ගේ ඇබ්බැහි වීම ද නරක අතට හැරෙමින් තිබූ නිසා ම COCA-COLA සමාගමේ අයිතිය තමන් සතු කරගත් ඒසා, නිෂ්පාදන විකුණුම් පුළුල් කරන්නට තම නායකත්වය ලබා දී ඇත. පළමුව ඇමරිකාවේ සියලු







John Stith Pemberton | Asa Candler | Frank Mason Robinson









සියලු ප්‍රාන්ත වලටත් පසුව කැනඩාව දක්වාත් COCA-COLA ප්‍රචලිත වීම ඇරඹුණු නමුත් යුරෝපීය කලාපයේ COCA-COLA ප්‍රචලිත කිරීමට ගත් උත්සාහය සාර්ථක වී නැත. ඊට හේතුව ලෙස සඳහන් වන්නේ ජර්මනියේ බියර්,වයින් හෝ ජලය හැර අනෙකුත් සිලුම් පාන වර්ග ළමුන් සඳහා පමණක් නිෂ්පාදනය වීමයි. එපමණක් ද නොව ප්‍රංශ ජාතිකයින් ඇමරිකානු පාන වර්ග මිලදී ගැනීම ඔවුන්ට සිදු කර ගන්නා අපහාසයක් ලෙසද සලකා ඇත.

1899 වර්ෂයේ දී ඒසාව හමුවීමට පැමිණි **"JOSIPH WHITE HEAD"** සහ **"BENJAMIN THOMSON"** නම් සුවිශේෂී නීතිඥයින් දෙදෙනා ඒසාට මෙසේ යොජනාවක් ඉදිරිපත් කර ඇත. **"FOUNTAIN"** බීමහල් වල COCA-COLA ඉතාමත් ජනප්‍රියව පවතින නිසා ඒවා බෝතල් කිරීමට අවස්ථාවක් ලබා දෙන මෙන් ඔහුගෙන් ඉල්ලා ඇති අතර එය තරමක හාස්‍යජනක අදහසක් යැයි සැලකූ ඒසා ඔවුන්ට මෙසේ පවසා ඇත. "ඩොලර් 1 ක වටිනාකමකට ඔබට ඕනෑතරම් COCA-COLA බෝතල් කර ගන්න පුළුවන්" බීම බෝතල් කිරීම සඳහා අදික මුදලක් වැය වන බව දන්නා නිසාම ඒසා එවැනි එකඟතාවයකට පැමිණි බව සඳහන් වේ. බීම බෝතල් කිරීම සාර්ථක වුවහොත් ඒසාට කිසිදු පාඩුවක් නොවීමත් සාර්ථක වුවහොත් වැඩිපුර බීම විකිණීමට අවස්ථාව සැලසීමත් ඊට හේතු ලෙස සඳහන් වේ. ඉන් අනතුරුව ජෝසප් සහ බෙන්ජමින් COCA-COLA බෝතල් කිරීමේ ව්‍යාපාරය සඳහා තවත් ආයෝජකයින් සම්බන්ධ කර ගැනීමත් සමඟ ම මෙම ව්‍යාපාරය ඇමරිකාවේ දැවැන්තම ව්‍යාපාරයක් බවට පත්වී ඇත. ඒසාවත් නොසිතූ පරිදි මෙම ව්‍යාපාරය දිනෙන් දින දියුණු වූ බව සඳහන් වේ. එහි සාර්ථකත්වය නිසා ම COCA-COLA වලට සමාන බීම වර්ග වෙළඳපළට හඳුන්වා දීමට ද සමහර පිරිස් කටයුතු කර ඇත. ඊට විසඳුමක් ලෙස කිසිවෙකුට පහසුවෙන් පිටපත් කළ නොහැකි අන්දමේ සුවිශේෂී හැඩයකින් යුත් බෝතලයක් නිර්මාණය කිරීමට COCA-COLA සමාගම තීරණය කළ අතරම එහි නව හැඩය තව තවත් පාරිභෝගිකයන්ව ආකර්ෂණය කර ගන්නාට සමත් වී ඇත.

වසර ගණනාවකට පසුවත් එනම් **1926** වර්ෂයේ දී අලෙවි කරන ලද COCA-COLA බෝතල් සංඛ්‍යාව FOUNTAIN බීමහල් වලදී අලෙවි කරන ලද COCA-COLA වීදුරු වලට වඩා වැඩි අගයක් ගෙන ඇත.ඒ අනුව ජෝසප් සහ බෙන්ජමින් යන දෙපළගේ මෙම නව අදහස COCA-COLA සමාගමෙහි අඛණ්ඩ පැවැත්මට බොහෝසෙයින් ඉවහල් වූ බව කිව හැක.

කෙසේ නමුත් COCA-COLA නිෂ්පාදන මෙසේ සාර්ථක ලෙස අලෙවි වූ වකවානුවක එනම් **1916** වර්ෂයේ දී COCA-COLA සමාගමෙන් ඉල්ලා අස්වෙන ඒසා සිය ව්‍යාපාර දරුවන්ට පැවරීමෙන් අනතුරුව ඇට්ලන්ටා නගරාධිපති ලෙස වැඩ භාරගත් බව සඳහන් වේ.

ඊට වසර 3කට පසුව ඔවුන්ගේ දරුවන් එම ව්‍යාපාරය ඩොලර් මිලියන 25 ක වටිනාකමකට ආයෝජකයින් කිහිපදෙනෙකුට විකිණූ අතර එය එවකට ඇමරිකානු එක්සත් ජනපදයේ සිදු කෙරෙනු විශාලතම ව්‍යාරික ගණුදෙනුව බව ද සඳහන් වේ.


COCA-COLA ආයතනය මිලදී ගත් එම ආයෝජකයින් අතර එක් බැංකු නිලධාරීවරයෙකු ද විය. ඔහු නමින් "ERNEST WOODRUFF" ය. ඔයුගේ මූලිකත්වයෙන් මෙම ආයතනය තව තවත් ජනතාව අතරට ගෙනයාමට කටයුතු කර ඇත. ඔහු COCA-COLA නිෂ්පාදනය නවීකරණය කර ඇති අතරම ඕනෑම් තැනකදී එම නිෂ්පාදන කටයුතු සිදු කිරීමේ දී එහි තත්ත්වයට කිසිදු බැලපෑමක් සිදු නොවන්නාටද වගබලා ගත්තේය.

ඔහුගෙන් පසුව COCA-COLA ආයතනයෙහි නව සභාපතිවරයා ලෙස පත්වූයේ ද ඔහුගේ ම පුත්‍රයාය. ඔහු නමින් **"ROBAT WOODRUFF"** ය. ඔහු ද මෙම නිෂ්පාදන කටයුතු එලෙසම පවත්වාගෙන යාමට මූලිකත්වය දී කටයුතු කර ඇත. එමෙන් ම ඔහු ව්‍යවසායක කටයුතු සඳහා සුවිශේෂී දක්ෂතාවයක් දැක්වූ පුද්ගලයෙකි. COCA-COLA සමාගමේ සභාපති ධූරයට පත්වන්නට පෙර ඔහු ට්‍රක්රථ රියදුරෙකු ලෙස සිය ව්‍යාපාර කටයුතු ආරම්භ කර ඇත. ඔහුගේ කාලයේ දී COCA-COLA හි සංයුතියෙන් කොකේන් ඉවත් කිරීමට කටයුතු කර ඇති අතරම COCA-COLA උඩු පියන ලෝහ වලින් නිර්මාණය කරන්නාටත් බෝතල් 6ක පැක් එකක් ලෙස එය පාරිභෝගිකයාට හඳුන්වා දීමටත් ස්වයංක්‍රීය යන්ත්‍ර වලට එය හඳුන්වා දීමටත් කටයුතු කර ඇත. එපමණක් ද නොව ඒසා විසින් ආරම්භ කරන ලද මෙම ව්‍යාපාරික කාර්යය තව තවත් පුළුල් කරන්නාටත් COCA-COLA සන්නාමය යුරෝපයට හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත්තේ ද රොබට් විසින්මය. මෙම සුවිශේෂී නිෂ්පාදනය යුරෝපය තුළ ප්‍රචලිත කිරීම සඳහා ඔවුන් පුළුල් අන්දමින් වෙළඳ ප්‍රචාරක කටයුතු පවා සිදු කර ඇත.

COCA-COLA නිෂ්පාදනය ඔවුන් හඳුන්වා දී ඇත්තේ කා අතරත් එක සේ ජනප්‍රිය සිසිල් බීම වර්ගයක් ලෙසයි. ඒ සමයෙහි වෙළඳපළට නිකුත් වූ COCA-COLA බෝතල් ශැම්පේන් බෝතල් මෙන් කොළ පැහැති වර්ණයක් ගත් අතර රත්තරන් පැහැති ආවරණයකින් යුක්ත විය. එමෙන් ම COCA-COLA සමාගම ඉතිහාසයේ බොහෝ වැදගත් අවස්ථා සහ සුප්‍රසිද්ධ පුද්ගලයින් වෙනුවෙන් ඔවුන්ගේ අනුග්‍රහයද ලබා දී ඇත. ඒ අතරින් ඇමරිකානු













ඔලිම්පික් කණ්ඩායමට 1928 වර්ෂයේ දී ඇම්ස්ටර්ඩෑම් සංචාරයේ දී දැක් වූ අනුග්‍රහය සුවිශේෂී ලෙස කැපී පෙණුනු අතරම ඔවුන් මෙහි දී 40,000 කට වඩා වැඩි COCA-COLA බෝතල් ප්‍රමාණයක් නොමිලේ ලබා දී ඇත. එමෙන් ම දෙවන ලෝක යුද සමයේ ලෝකයේ කොතැනක හෝ යුද වදින ඇමරිකානු සොල්දාදුවන් වෙනුවෙන් කෙසේ හෝ COCA-COLA ලබා දීමට ද ඔවුන් පොරොන්දු වී ඇත.

එපමණක්ද නොව COCA-COLA පානය කරන රතු පැහැ ඇඳුමින් සැරසුණු නත්තල් සීයාගේ චරිතය ලෝකය පුරා ප්‍රචලිත කරන ඔවුන් ඒ චරිතය සඳහා ඉන් පෙර කොළ පැහැති ඇඳුමකින් සැරසුනු කෙට්ටු නත්තල් සීයෙක් යොදාගත් බවද මෙහි දී සඳහන් කළ යුතුමය. කෙසේ නමුත් වර්තමානය වන විට COCA-COLA පානය ඇමරිකානු සංස්කෘතියට තදින් ම බැඳුනු නිෂ්පාදය වී හමාරය. ඒ බලපෑම කොතෙක් ද කියතොත් එය මේ වන වීට ඇමරිකානු ජාතික සලකුණක් බවටද පත්ව ඇත. ලෝකය පුරා හඳුන්වාදුන් නිෂ්පාදන අතුරින් දෙවන තැන හිමි කර ගන්නට මේ වන විට COCA-COLA නිෂ්පාදනය සමත් වී ඇති අතර එහි පළමුතැන හිමි කර ගන්නට "NIKE" වෙළඳ සන්නාමය සමත් වී ඇත.

ඒ වන විට එක් දිනක් ඇතුළත ලෝකයේ රටවල් 200ක COCA-COLA නිෂ්පාදන බිලියන 2ක් අලෙවි වී තිබේ. "ROBAT" COCA-COLA සමාගමෙන් විශ්‍රාම ගැනීමට පෙර ඔහුගේ මේසය මත සටහනක් තබා තිබූ අතර එය මෙසේ සඳහන් වූ බව කිය වේ. "යම් කිසි ක්‍රියාවක ගෞරවය ලබා ගන්නා පිළිබඳව තැකීමක් නොකරන තාක්කල් මිනිසෙකුට කළ හැකි දේවල් සීමා රහිත ය" යන බවයි. ඒ බව පසක් කරමින් යුද්ධයක දී මරණය අභියස සිටි ඖෂධ වෛදියෙක්ගේ සහ ඔහුගේ අනුප්‍රාප්තිකයන්ගේ කැපවීමෙන් ඩොලර් බිලියන 74ක වත්කමක් සහිතව ලෝකයේ ජනප්‍රියතම නිශ්පාදන සමාගමක් ලොවට දායාද වූයේ ඒ අයුරිණි.








ගයත්‍රි කරුණාදාස
Editor of Gemcity Magazine

## N STEEL
ENGINEERING SERVICES

**මැණික් ගරන මැෂින් නිෂ්පාදනය සහ අලුත්වැඩියාව**

වානේ, සුදු යකඩ, ඇලුමිනියම්, සින්ක් කෝටඩ් තහඩු අවශ්‍ය ප්‍රමාණයට නැවීම සහ කැපීම

**වෙල්ඩින්, ෆැබ්‍රිකේශන්, මිග් වෙල්ඩින්**

ලේත්, මිලිං ශේපින් වැඩ සහ අමානෝ රෑෆින් ශීට්, වැහිපීලි, වඩිම්බු හා උපාංග

**වානේ ගොඩනැගිලි සැලසුම් කිරීම හා ඉදිකිරීම**

එක්ස්කැවේටර් බකට් අලුත් වැඩියාව



Nalinda Kumarage
Proprietor

077 222 47 30

MALANGAMA, RATNAPURA

www.nsteeleng.com

## KULATHILAKA GEMS
Dealers in Genuine Gems



Mr. Kulathilaka
Proprietor

077 750 8088


DEMA'S
DEMA'S
DEMA'S
WINSIS DENIM
CAZPER
PREMIUM QUALITY
BRANDED GENTS WEAR
DEMA'S OUTLET
0718525865 0775795865
0364307810
KURUWITA.
In front of People's Bank


Head Office
No: 394, Colombo Road, Ratnapura.
045 22 33 313
BLOSSOMS
we bloom your wedding dreams...
Branches
Ratnapura
Lellupitiya
Avissawella
Rajagiriya
WEDDING
Wedding Planning
Wedding Decors
Church Decors
Wedding Cars
Entertainment DJ
Ashtaka
EVENT
Parties & Corporate
Events
Aluminium Stage
Lighting Systems
Sounds Systems
LED Wall
Truss Bar Systems

# යූරි ගගාරින්ගේ අභ්‍යාවකාශතරණය පිළිබඳ සත්‍ය කතාව

ලෝකයේ අභ්‍යාවකාශතරණය කළ පළමු මිනිසා ලෙස රුසියානු ජාතික "යූරි ඇලෙක්සි විච් ගගාරි" ඉතිහාසයට එක්වෙයි. හැකි සෑම අවස්ථාවකම එකිනෙකා අභිබවා යන්නට උත්සහා දැරූ ඇමරිකාවත් රුසියාවත් අතර එවකට දරුණු යුද්ධයක් පැවතුණු නිසාම රුසියාවට මෙය විශේෂ ජයග්‍රහණයක් විය. එමෙන්ම ඔවුන් අතර තරඟකාරීත්වයක් පැවතුණු ක්ෂේත්‍ර අතර අභ්‍යාවකාශතරණයට ප්‍රමුඛස්ථානයක් හිමි විය. "Space race" ලෙස එය නම් කර තිබුණි.

ඇමරිකානුවන් විසින් 1969 දී නීල් ආම්ස්ට්‍රෝන් සඳ මත පා තැබූ බව කියන පුවත ප්‍රසිද්ධ කිරීමත් සමඟ ඒ තරඟය ඔවුන් විසින් ජය ගත් බව ලෝකයේ බහුතරයකගේ පිළිගැනීම විය. නමුත් මෙම යුද්ධයේ මුල් අවදිය රුසියාව ඉදිරියෙන් සිට ඇති අතර ඔවුන් ඇමරිකාවට පෙර එක් මිනිසෙක් සහ සත්ත්වයෙක් අභ්‍යාවකාශයට යැවූ බවද කියවේ.

වසර 1957 දී රුසියාව විසින් "ස්පුට්නික් 01" යානය අභ්‍යාවකාශගත කිරීමත් සමඟ එය අභ්‍යාවකාශයට ළඟාවුණු පළමු යානය බවට පත් කරන්නට රුසියාවට හැකියාව ලැබිණි. ඒ පුවත ඇමරිකානුවන්ට අමිහිරි අත්දැකීමක් වුණු අතර ඊට සති කිහිපයකට පසුව එම වසරේම නොවැම්බර් මස 03 වන දින රුසියාව විසින් " ස්පුට්නික් 02" යානයෙන් ලයිකා යන බැල්ල අභ්‍යාවකාශයට යැවීමෙන් රුසියාව තවත් ඉදිරියට ආ බව සඳහන් වේ. අභ්‍යාවකාශයට ගිය පළමු සත්ත්වයා ලෙසද මෙම ලයිකා යන බැල්ල ඉතිහාසයට එක්වී ඇත. ඉන් අනතුරුව රුසියාවේ මූලික අරමුණ වී ඇත්තේ මිනිසෙක් අභ්‍යාවකාශගත කොට ඔහුව කිසිදු අනතුරකින් තොරව නිරුපද්‍රිතව නැවත ගෙන්වා ගැනීමයි. 1961 වසරේ දී එය අති සාර්ථකව ඉටු වූ බව ඉතිහාසයේ සඳහන් වන නමුත් එය ඉතා භයානක වූවක් බව කියවේ. රහසිගත තොරතුරු වලට අනුව යූරි ගගාරි සිය ජීවිතය පවා බේරාගෙන ඇත්තේ පෙර පිනකටය. එපමණක්ද නොව ඔහු මිය යාවියැයි සිතා ඒ සඳහා දිය යුතු පිළිතුරුද රුසියානු බලධාරීන් විසින් සූදානම් කර තබා තිබූ බව හෙළිවී ඇත. මේ අභ්‍යාවකාශ ගමන පිළිබඳව ඊට දින දෙකකට පෙරත් රුසියානු බලධාරීන්ට දැඩි කුකුසක් තිබූ බව කියවේ. ඒ මොහොත වන විට ඉන්ජිනේරුවන්ගේ සොයාගැනීම් වලට අනුව අනාවරණය වී ඇත්තේ ගගාරිගේ බර සහ ඔහුගේ අභ්‍යාවකාශ ඇඳුමෙහි බරෙහි එකතුව පෙර ගණනය කර තිබූ පරිදි අභ්‍යාවකාශයට ආරක්ෂා සහිත විය හැකි උපරිම බරට වඩා 14Kg වැඩි බවයි. එම නිසා ගගනගාමී ඇඳුමට අත්‍යවශ්‍ය නොවන බව හැඟුණු සෑම උපාංගයක්ම එයින් ඉවත් කර ඇත. ඒ ඉවත් කිරීම කිසිදු පරිස්සමකින් තොරව සිදු වූ නිසා එහි සංවේදක (Sensors) දෙකකට හානි වී ඇති අතර එක පරිපථයක් ශෝට් වීමක් නැතිනම් ලුහුවත් වීමක් සිදු වී ඇත. පසුකාලීනව අනාවරණය වුණු රහසිගත තොරතුරු කිහිපයකම මේ තාක්ෂණික දෝෂ හැකිතාක් නිවැරදි කරන්නට රුසියානු ඉන්ජිනේරුවන් උත්සාහගෙන ඇත.




ඕනෑම අවදානමක් දරා කෙසේ හෝ මිනිසෙක් අභ්‍යාවකාශ ගතකොට ඇමරිකාව අභිබවා යෑමට රුසියානු බලධාරීන්ට තිබූ උණන්දුව පිළිබඳවද එහි සඳහන් වී ඇත. ඒ වෙනුවෙන් යූරි ගගාරිගේ ජීවිතය අවදානමෙහි හෙළන්නට වුවත් ඔවුන් පසුබට වී නැත. ඔහුගේ ගගනගාමී ඇඳුම පවා සරලව අමුණා නිම වූවක් බව සඳහන් වීමෙන් ඒ බව තහවුරු වේ. එමෙන්ම අමතර බරක් ගෙනදෙන ගින්නකදී සපයන ආරක්ෂක පද්ධතිය පවා ඔහුගේ ඇඳුමින් සහ අභ්‍යාවකාශ යානයෙන් ඉවත් කර තිබූ බව අනාවරණය වේ. ඔහු රැගත් යානය ගුවන්ගත වී මිනිත්තු 03න් එහි පාලන පද්ධතිය අඩ වශයෙන් අකර්මන්‍යතාවයකට පත්ව ඇති අතර ඊට අනුබද්ධ රොකට් යන්ත්‍රය ක්‍රියා විරහිත වී තිබුණේද නියමිත වේලාවට වඩා තප්පර 15කට පසුවයි. යානය තුළ ඔහු අල්ලාගෙන සිටි කොටසක් ගැලවී යාමෙන් තමන් යානය තුළ යම් කාලයක් පාවෙමින් සිටි බව ඔහුගේම සටහනකින් පසුකාලීනව අනාවරණය වී ඇත. මිනිත්තු 108කට පසුව ඔහු සාර්ථකව ගොඩබිමට ආ බව නිල වශයෙන් සටහන් වී තිබූ නමුත් ඔහුට අනුව එයත් කිසිදු සැලැස්මකට අනුව නොවූ බව සඳහන් වේ. ඔහු ගොඩබසින්නට සැලසුම් කර සිටි ස්ථානය ඔහුට මඟහැරී ඇති අතර ඒ 600Km කින් බව සටහන් වී ඇත. එවකට රුසියාව සුමට ගොඩබෑමකට අවශ්‍ය තාක්ෂණික ක්‍රම තමන්ගේ ව්‍යාපෘතිවලට භාවිත කරන්නට තරම් දියුණු මට්ටමක නොවීය. එම නිසා යූරි ගගාරි තමන් නැවත පෘථිවි වායුගෝලයට ආ කැප්සූවලයෙන් 7000m ක් ඉහළ අහසේ සිට පැරෂුටයක ආධාරයෙන් ගොඩබිමට පැමිණ ඇත. එම මොහොතෙහි රැහැණක් පැටලී තිබූ නිසා ඔහුට තමන්ගේ ගගනගාමී ඇඳුමෙහි බ්‍රීදින් වෑල් එක විවෘත කර ගන්නට මිනිත්තු 06ක පමණ කාලයක් උත්සාහ දරන්නට සිදු වී ඇත. කෙසේ හෝ ඔහු නැවත නිරුපද්‍රිතව පැමිණි නිසාවෙන් ලෝකයේ අභ්‍යාවකාශගත වූ පළමු මිනිසා ලෙස ඉතිහාසගත විය.


sputnik 1
October 4, 1957


Laika
3 November 1957


මේ ගමනේ දී ඔහු මියගියහොත් ඊට අදාල සියලු වාර්ථා මකා දමන්නට රුසියානු බලධාරීන් සූදානමින් සිටි බව කියවේ. එම නිසා මේ අවස්ථාවට පෙරත් රුසියාව අභ්‍යාවකාශගත වන්නට උත්සාහ දරා ඒවා අසාර්ථක වීමෙන් ඒ පිරිස් මිය යන්නට ඇතැයි බොහෝ දෙනාගේ මතයයි. මේ වනතෙක් කිසිවෙකුට ඒ බව තහවුරු කර ගන්නට තරම් අවශ්‍ය සාක්ෂි හමුවී නැති නමුත් රොකට් විද්‍යාව සම්බන්ධ විශේසඥවරයෙක් වන හර්මන් ඕබත් 1959 දී පවසා ඇත්තේ යූරි ගගාරී අභ්‍යාවකාශ ගතවීමට පෙරත් මියගිය රුසියානු ජාතික ගගනගාමීන් පිළිබඳව විශ්වාසනීය තොරතුරු ඔහුට ලැබුණු බවයි. එමෙන්ම එවසර තුළදීම ඉතාලියානු පුවත්පතක ජෙට් ජාතික ඇලෙක්සිය ලෙඩොක්සි නම් පුද්ගලයා රහසිගතව නමුත් අසාර්ථක අභ්‍යාවකාශගත වීමේ මෙහෙයුමක් හේතුවන් මිය ගිය බවද ඔහු දන්වා ඇත. එමපණක්ද නොව මිය ගිය තවත් ගගනගාමීන් තිදෙනෙක්ගේ නම්ද ඔහු මෙසේ හෙළිකර ඇත. ඒ සේර්ගේ ශිවොරින්, ආන්ද්‍රේ මිට්හොව් සහ මරියා ග්‍රොමෝවා ය.


Achille (1933-2015)
Giovanni Battista (1939-2024)

960 දී අකිලේ සහ ගියෝවානි බැටිස්ටා යන ඉතාලි ජාතික සොහොයුරන් දෙදෙනා රුසියානු අභ්‍යාවකාශ පර්යේෂණ වල රහස් පණිවුඩ වලට රේඩියෝ තාක්ෂණය ඔස්සේ සවන් දී සිට ඇති අතර ඔවුහු යූරි ගගාරීගේ මෙහෙයුමට ආසන්නව දියත් වී අසාර්ථක වුණු මෙහෙයුම් වලට අදාල පණිවුඩ වලටද සවන්දුන් බව පසුකාලීනව හෙළිදරව් කර ඇත. ලැදිමීර් ඉයුෂින් නම් පුද්ගලයා 1959 දී ගොඩබිමේ සිට 29Km ක් ඉහළ කිරීමට නියමිත කර තිබුණේද ඔහුවය. නමුත් අභ්‍යාවකාශගත වීමට නියමිත දිනට දින දෙකකට පෙර ඉයුෂින් දරුණු රිය අනතුරකට ලක්වීම නිසාවෙන් ඒ සඳහා යූරි ගගාරීව තෝරාගැණුන බව රුසියානු බලධාරීන් ප්‍රකාශයට පත්කර ඇත. නමුත් සමහරෙකුගේ මතය වූයේ ඉයුෂින් අභ්‍යාවකාශගත වුණ අතරතුරදී ඔහු රැගත් යානය චීනයට කඩාවැටුණ බවත් ඉන්පසුව ඔහුව චීන අත්අඩංගුවට පත්වූ බවත්ය. ඉන්පසුව ඉයුෂින්ගේ තොරතුරු ලෝකයට අනාවරණය නොවූවත් මිය ගිය සමහර ගගනගාමීන් පිළිබඳ තොරතුරු සඟවාලීමට ඔවුන් අසමත් වී ඇත. ඒ අය අතර 1960 දී මිය ගිය ව්ලැදිමීර් කොමරෝ ද විය. ඔහු සෝවියට් දේශයේ සෝයුස් 01 මෙහෙයුමට සම්බන්ධ වී සිටි අයෙක්ය. ඔහු රැගත් යානයේ ඇති වූ තාක්ෂණික දෝෂයක අඩුලුහුඬුකම් රාශියක් නිසා අවසානයේ දී එම යානය කඩාවැටී ඇත්තේ කොමරෝගේ ශරීරය පුළුස්සා උණුකර දමමින්ය. මීට අමතරව ගියෝගි ඩොබ්‍රෝස්කි, වික්ටර් හසායව් සහ වොල්කොව් යන නියමුවන් තිදෙනාගේද මරණ පිළිබඳ තොරතුරු ද රුසියාව සඟවන්නට උත්සාහ ගත්තද ඒ කිසිවක් සාර්ථක වී නැත.

1971 දී සෝයු 02 මෙහෙයුමට සම්බන්ධව සිටි මොවුන් එය සාර්ථකව ආරම්භ කර අවසානයේ යානයේ කැප්සුවලය ගොඩබිමට පැමිණියද යානයේ සිටි තිදෙනාම ඒ වනවිටත් මියගොස් සිටිබව හෙළිවේ. ඊට හේතුන් ලෙස දන්වා ඇත්තේ භාහිර සහ අභ්‍යයන්තර වායුපීඩනය යාමනය කරන යානයේ කපාටය නිසි වේලාවට පෙර විවෘත වීම නිසා තත්ත්පර කිහිපයක් ඇතුලත කුටියෙහි වාතය සම්පූර්ණයෙන්ම ඉවතට ගොස් තිබීමෙන් ඔක්සිජන් නැතිවීම බවයි. යූරි ගගාරීගේ කතා පුවත මෙන්ම ලොවෙන් වසන් වුණු, නමුත් ලෝකයට හෙළිවිය යුතු තවත් බොහෝ සත්‍ය කතා පුවත් රාශියක් සැඟවී ඇතයි මේ කතා පුවතින් අනාවරණය වේ.


ගයත්‍රි කරුණාදාස
Editor of Gemcity Magazine



Hermann Oberth


Vladimir Komarov


Soyuz 11 mission
June 6, 1971
Georgy Dobrovolsky, Vladislav Volkov, Viktor Patasayev

# ජීවිතයට මැණික්



ග්‍රහයන්ට හිමි මැණික්

* රවි (හිරු) – පද්මරාග (Pink sapphire)
* චන්ද්‍ර (සඳු) – මුතු (Pearl)
* කුජ (අඟහරු) – රතු (Ruby)
* බුධ – පච්ච (Emerald)
* ගුරු (බ්‍රහස්පති) – පුෂ්පරාග (Yellow Sapphire)
* ශුක්‍ර (සිකුරු) – දියමන්ති (Diamond)
* ශනි (සෙනසුරු) – නිල් (Blue Sapphire)
* රාහු – ගෝමේද (Hessonite)
* කේතු – වෛරෝඩි (Cat's Eye)

පද්මරාග



පද්ම යනු නෙළුමට තවත් නමකි. පද්මරාග යනු නෙළුමක පැහැය ඇති බවයි. රවි හිමි පද්මරාග පැළඳීමෙන් ධනය, බලය නායකත්වය ලබයි. එහෙත් පළුදු වූ පද්මරාග පැළඳීම නිසා පිරිහීම, ධන ධාන්‍ය විනාශය, අපවාදය මෙන්ම භය ද ඇතිවන බව කියා තිබේ.

පච්ච තෝර / මරකත



මරකත පැළඳීමෙන් බුද්ධි වර්ධනය සහ ඉද්වාකර්ෂණය ලැබේ. මරණයෙන් එතෙර කරන්නේය යන අරුතින් මරකත යන නම සෑදී තිබේ.

වෛරෝඩි



බළල් ඇස් මෙනි. මෙම මැණික පැළඳ ගැනීමෙන් වාත හා සෙම දෝෂ සනස බවත්, පෝෂණ ඌණතා නිසා ඇතිවන ශාරීරික දුර්වලතා සමනය කරන බවත් කියා ඇත. වෛරෝඩි කේතු ග්‍රහයාට හිමි වෙයි.

රතු



රතු කැට නමින් හඳුන්වන මෙය පැළඳ ගැනීමෙන් ධෛර්යය, වීර්යය, ඇතිකර ආයුෂ වර්ධනය කරන බව කියා තිබේ. කුජ ග්‍රහයා අධිපති වෙයි.

ගෝමේද



ගව මූත්‍රවල පාට ඇති යන අර්ථයෙන් ගෝමේද නම් වන්නේය. රාහු ග්‍රහයා හිමි වෙයි. රතු මිශ්‍ර කහපාට මෙම ගල පැළ ගැනීම මගින් ශුභ පල උදා කරන අතර පළුදු වූ ගෝමේද නිසා සම්පත් හා වීර්යය හානිකරන බව කියා තිබේ.

දියමන්ති / සුදු



සිකුරු හෙවත් කිවි ග්‍රහයාට හිමි දියමන්ති පැළඳීම සතුරු භය හා විෂ මර්දනය කරන බව කියා ඇත. එහෙත් දරුවන් අපේක්ෂා කරන යුවතියන්ට දියමන්ති දැරීම සුදුසු නැති බව කියා තිබේ.

මුතු



මුතු වර්ග අටකි. ඇතුන්ගෙන්, නාගයන්ගෙන්, සක්වලින්, උණගස් වලින්, මත්ස්‍යයන්ගෙන්, අකුණු වලින්, සූකරයන්ගෙන් හා බෙල්ලන් ගෙන් මුතු හට ගනී. බෙල්ලන්ගෙන් ලැබෙන මුතු බහුලය. මුතු පැළඳීමෙන් සෞභාග්‍යය, බුද්ධි වර්ධනය හා කීර්තිය ලැබෙන අතර සඳු ග්‍රහයා අධිපති වෙයි.

නිල්



නිල් මැණික් වර්ග රාශියක් ඇත. ශනි හිමි මැණික කාක නිල නම් වෙයි. එය කළු නිල් පාටින් යුක්තය. පැළඳීම මගින් ඉවසීම, ගැඹුරු ඥානය, දරා ගැනීමේ ශක්තිය හිමි වේ.

පුෂ්පරාග




කහ පාටින් යුක්ත මෙම ගල බ්‍රහස්පති හෙවත් ගුරු ග්‍රහයාට හිමිවෙයි. කීර්තිය, ඥානය සැප වර්ධනය කරන මෙම ගල පැළඳ ගැනීමෙන් ස්ත්‍රීන්ට පුත්‍ර ලාභ හෙවත් දරු සම්පත් උදාකරන බව කියා තිබේ.

**මැණික් මතට ආලෝකය හෝ වෙනත් කිරණ වර්ගයක් වැටුනු විට එයින් කොටසක් ගල මැදින් ගලා ගොස් නිකුත් වන අතර තවත් කොටසක් පරාවර්තනය වන්නේය. තුන්වැනි කොටසක් ගල තුළම රැඳේ. මේ රැඳෙන කොටස වෙනත් ශක්තීන් බවට පත් වී ගලෙන් නිකුත් විය හැකිය. මැණික් පැළඳීමේදී ශරීරය හා මනස සහ සංයෝගයට මෙම කිරණ බලපායි.**



SONEMRO
JEWELLERS
සොනෙම්රෝ රන් වාසි
රන් භාණ්ඩ සඳහා
25%
දක්වා වට්ටම්
රන් චේන් සඳහා අඩුම මිල
ඔබගේ පැරණි රන් ආභරණ සඳහා
ඉහළම හුවමාරු මිලක්
සෑම රන් භාණ්ඩයක් සඳහාම
වගකීම් සහතිකය
Maharagama Branch
High-Level Road,South, Maharagama
0112 897 665
Rathnapura Branch
173 Main St, Ratnapura
045 2121 141
Celebrating Life's Special Connections


Nihal Gems
Nihal Gems
077 77 00 149




# නිහාල්

මැණික්

## NIHAL GEMS (PVT)LTD

**NIHAL JAYATHILAKA**
**Director**

# 077 77 00 149

www.nihalgems.com
nihal@nihalgems.com



244, Colombo Road,
Moragahayata,
Ratnapura,
Sri Lanka.



# ශ්‍රී ලංකාව සහ මැණික් කර්මාන්තය



ශ්‍රී ලංකාව ලෝකයේ ඇති විශිෂ්ඨතම මැණික් ප්‍රභවයක් සහිත වෙළඳ මධ්‍යස්ථානයකි. බොහෝ සම්ප්‍රදායන්ගෙන් පොහොසත් මෙන් ම අසමසම දේශයක් වන ශ්‍රී ලංකාව නවීන මැණික් වෙළඳපොළ තුළ සුවිශේෂී නමක් දිනා ඇති අතරම දේශීය සහ විදේශීය වශයෙන් ද පතල් කර්මාන්තය පවත්වාගෙන යයි. පසුගිය වසර කිහිපය තුළ නවීන තාක්ෂණය සහ ව්‍යාපාරික ආකෘති සමඟ එහි සැලකිය යුතු දියුණුවක් දක්නට ලැබුනද එහි සාම්ප්‍රදායික භාවිතයන් තුළ කිසිදු වෙනසක් නොවීය.

## විශ්මිත දූපත

ශ්‍රී ලංකාව විවිධ පරිසර තත්ත්වයන්ගෙන් සමන්විත දූපතකි. මෙරට පිහිටි භූමි ප්‍රදේශයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් පැතලි සහ පෙරළෙන සහිත වන අතරම දකුණු මධ්‍යම අභ්‍යන්තරය කඳු පන්ති වලින් අලංකාර වී ඇත. මෙරට තුළ කෘෂිකර්මාන්තයට නිරන්තරයෙන් පැවැත්මක් තිබූ අතර මෙහි තීව්‍ර හරිත කුඹුරු සහ රබර් ගස් මෙන් ම විවිධ වැවිලි වර්ග බහුල විය.

ශ්‍රී ලංකාවෙහි පිහිටීම අනුව මොසම් කාල දෙකකි. ඊසාන දෙසින් දෙසැම්බර් සිට මාර්තු දක්වාත් බොහෝ පතල් කැනීම සිදු වන නිරිත දෙසින් ජූනි සිට ඔක්තොම්බර් දක්වාත් මෝසම් පවතියි. අතීතයේ මෙරට යහපත් කාලගුණයක් පැවතුන ද මේ වන විට විටින් විට කාලගුණික විපර්යාසයන්ට අපි මුහුණ දෙන්නෙමු. පසුගිය කාලවකවානුව තුළ කඩින් කඩ ඇති වූ වැසි කුණාටු තත්ත්වයන් නිසා පතල් කැනීමේ කටයුතු වලට ද බාධා ඇති විය.





මැණික් කැණීම්



සීගිරිය

## ඉතිහාසය, සංස්කෘතිය සහ මිනිසා

වසර 300,000 කට වැඩි කාලයක සිට ශ්‍රී ලංකාවේ මිනිසුන් වාසය කර ඇතැයි. විශ්වාස කෙරේ. විවිධ සංස්කෘතික උරුමයන්ගෙන් පොහොසත් වූ ශ්‍රී ලංකාව නිරන්තරයෙන් සංචාරකයින්ගේ ආකර්ෂණයට බඳුන් වේ. ඔවුන් මෙම දූපත සහ මෙහි ජනයාගේ විස්තර දැන ගැනීමට වැඩි කැමැත්තක් දක්වයි. එය මෙරට සංචාරක ක්ශේත්‍රයට සහ ආර්ථික දියුණුවට වාසි ගෙන දෙන්නකි. එම සංචාරක ප්‍රදේශ අතුරින් මැණික් ගැරුම් ප්‍රදේශයක් වන සංස්කෘතික උරුමයක් වූ සීගිරිය **යුනෙස්කෝ** ලෝක උරුම අඩවියක් ලෙස නම් දරයි.

## ලෝකයේ හොඳම සම්ප්‍රදාය, පළපුරුද්ද සහ නවීකරණය



ශ්‍රී ලංකාවේ සමස්ත පතල් කර්මාන්තය සහ වෙළඳපළ ලේඛනගත කිරීමෙ දී වඩාත් ආකර්ෂණීය අංගයක් වන්නේ සම්ප්‍රදාය, අත්දැකීම් සහ නවීකරණය යන ඒවායෙහි සුසංයෝගී සහ ඵලදායී සම්මිශ්‍රණයයි. පතල් කැනීම්, වෙළඳාම්, මැණික් කැපීම්, ස්වර්ණාභරණ නිශ්පාදන අංශයන්හි මෙය පැහැදිලිව පෙනෙන්නට ඇත. පතල් කැනීම් ප්‍රධාන වශයෙන් සාම්ප්‍රදායික ක්‍රම භාවිතයෙන් සිදු කරනු ලබයි. මැණික් කැපීම් යනු අතේ බලයෙන් ක්‍රියාත්මක වන ශිල්පීය ක්‍රමවල සිත් ඇදගන්නා සුළු ක්‍රමවේදයකි. ප්‍රවීණත්වය සහ ඇඩී ඉවසීම පවත්වාගෙන යන නිර්වද්‍ය කැපීම් ක්‍රමවේදයක් මැණික් කැපීම් කර්මාන්තය තුළ භාවිත වේ.

ස්වර්ණාභරණ සැලසුම් කිරීම සහ නිශ්පාදනයන් දේශීය සහ විදේශීය වෙළඳපළට ඍජුවම සම්බන්ධ වේ. සාම්ප්‍රදායික 22K, 24K රන් ආභරණ මංගල උත්සව සඳහා ද ආයෝජන සඳහා ද අවශ්‍ය අවස්ථාවන්හි උකස්කිරීම් සඳහා ද භාවිත වන මූල්‍ය වත්කමක් ලෙස ඉහළ ඉල්ලුමක් ගනී. ඒ නිසා ම සංචාරක මිල දී ගැනීම් ඉහළ නැංවීම, අපනයන සහ දේශීය වෙළඳපොළ පුළුල් කිරීම අරමුණු කර ගනිමින් එකිනෙකට වෙනස් වූ අලංකාර නිර්මාණ වෙළඳපළට හඳුන්වා දීම එම නිර්මාණ ශිල්පීන් මෙන් ම වෙළඳුන් ද නිරන්තරයෙන් කටයුතු කරයි.

### පතල් කැනීම්

ශ්‍රී ලංකාවේ පතල් කැනීම් සඳහා බලපත්‍ර නිකුත් කරණු ලබන්නේ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) විසිනි. 2013 වසරේ දී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 6500කට වඩා වැඩිය. ඒ අතරින් 6000කට වැඩි ප්‍රමාණයක් සම්ප්‍රදායික ක්‍රම භාවිත කරමින් පතල් කැනීම් සිදු කරයි. තවත් කොටසක් යාන්ත්‍රික ක්‍රම භාවිත කරමින් සහ ගඟෙහි පතල් කැනීම් සිදු කරයි. යාන්ත්‍රික කැනීම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ දී ඉතා දැඩි මාර්ගෝපදේශන අනුගමනය කරන නිසාම 2013 වසරේ දී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 10කට සීමා විය.



ශ්‍රී ලංකාවේ බොහෝ වෙළඳ සහ නියාමන ආයතන මහා පරිමාණ මැණික් කැනීම් වලට විරුද්ධය. ඔවුන් සලකන්නේ සාම්ප්‍රදායික කුඩා පරිමාණ පතල් පරිසරයට අඩු හානියක් ඇති කරන බව සහ එමඟින් වැඩි පිරිසකට ස්ථාවර රැකියා ලබා දීමට හැකි වන බවත්ය.

මෙරට සම්මත වළ පතල 2mx4m ප්‍රමාණයේ සිරස් පටු වලකින් යුක්ත වේ. වළවල් ගැඹුරු හෝ තද බිමකින් යුක්ත වේ නම් පතල් කම්කරුවන්ට වර්ග 2m වළක් හෝ 2mක වටකුරු වලක් හාරා ගත හැකිය. බොහෝ වලවල් 5mත් 25m ත් අතර වුව ද 50m දක්වා ගැඹුරු විය හැකිය.





අතීතයේ සාම්ප්‍රදායික මැණික් කැපීම

සාමාන්‍යයෙන් ඉඩම් හිමියා, පතල් කැනීමේ අයිතිය දරණ තැනැත්තා, වතුර පොම්පය සපයන්නා සහ පතල් කරුවන් ඇතුළු තවත් කිහිපදෙනෙක් මෙම ව්‍යාපාරයට සම්බන්ධ වේ. මැණික් ගල් අලෙවියේ දී ලබන ආදායමෙන් කොටසක් ඔවුන් සියලුදෙනා අතර බෙදී යනු ඇත.

එතරම් ප්‍රකට නොවූවත් ගංගා කැනීම් ශ්‍රී ලංකාවේ මැණික් ගැරීමේ තවත් සාම්ප්‍රදායික ක්‍රමවේදයකි. මැණික් නිපදවන ප්‍රදේශයන්හි ගංගාවල ගංගව නැමෙන හෝ වෙනත් ආකාරයකින් මන්දගාමී වන ඇලවියල් නිදි අඩංගු විය හැක. ගංගා පතල්කරුවන් ඔවුන්ගේ කැනීම් කටයුතු සඳහා නොගැඹුරු ජලයේ ජලය මන්දගාමී වන තැන ලී හෝ පාෂාණ වේල්ලක් ඉදිකර බොරළු උගුලට හසුවන විට එක් පැත්තකින් බොරළු ගැලවීමට ඉඩ සලසයි.

දිගු ලී කණු වලට ලම්භකව සවි කර ඇති ලෝහතල භාවිත කරමින් පතල් කරුවන් බොරළු ඉවත් කරවයි. ඉල්ලම් වලට ළඟාවන තෙක් ම ඔවුහු අදික බර ඉවත් කරති. ඉන්පසුව ඔවුන් දිගු උල් සහිත වානේ දඬු භාවිත කරමින් ඉල්ලම් බුරුල් කර එය ඉහළට ඇදගෙන යන අතර ම ගලායන ජලයට මැණික් සහිත බොරළු සෝදා ගැනීමට ඉඩ සලසයි. ඔවුන් පෙනෙන්නට ඇති මැණික් ගල් ඉවතට ගන්නා අතර ඉතිරිව ඇති බොරළු තව දුරටත් සේදීමට ලක් කරයි.







මැණික් වෙළඳාම

GIA®

## වෙළඳාම

1970 සහ 80 ගණන් වල තායිලන්තය අභිබවා ගිය ශ්‍රී ලංකාව වර්ණ මැණික් වෙළඳාමේ ප්‍රධාන ගෝලීය බලවතෙකු ලෙස එහි තත්ත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා සිය ව්‍යාපාරික උපායමාර්ග සහ ආනයන/අපනයන රෙගුලාසි වෙනස් කර ඇත. ආනයන ක්‍රියාවලිය සරල කිරීම සහ තහනම් තීරුබදු ඉවත් කිරීම මඟින් මැඩගස්කරය ඇතුළුව ලෝකයේ ඕනෑම තැනක සිට රළු නිල් මැණික් මිල දී ගැනීමට ශ්‍රී ලාංකික අලෙවි නියෝජිතයන්ට දැන් හැකියාව ලැබී ඇත.

# ANIL GEMS

GEMDEALERS & GEMMINERS

**Anil Galathura**
Proprietor

**Office :**

# 12 A Council Avenue,
Ratnapura, Sri Lanka.

Tel : 045 - 2222239
Mobile : 077 - 3562803

**Residence:**

No. 26,Godigamuwa,
Ratnapura, Sri Lanka.

Tel : 045 - 2231365



E-mail : anilgalathura@icloud.com

# KING GEMS

Importers and Exporters of Precious and Semi Precious Gem Stones

**Manoj Mohotti**
Proprietor



**Office:**

# 12A Council Avenue,
Ratnapura,
Sri Lanka

Tel 045 - 2222239
Mobile 077 - 7735431

**Residence:**

No. 241/B, Colombo Road,
Ratnapura,
Sri Lanka.
Tel : 045 - 2226947

No. 21/53, PolhengodaGardens,
Colombo 05, Sri Lanka.
Tel : 011 - 2829133

E-mail : kinggems@gmail.com

# PINWATTA GEMS

*Dealers in Gems.*



P.K.M.L. Pinwatta
Pathakada, Pelmadulla.
T : 0452 274 133
M: 0773 023 415 / 0777 278 130

PINWATTA GEMS
No.122/A, Main Street,
Pelmadulla.
T : 0452 274 980






# සාර්ථක ව්‍යාපාරයක් ආරම්භ කරන හරිමඟ

පාසල් අධ්‍යාපනයෙන් පස්සේ බොහෝ දෙනෙක් කරන්නෙ රස්සාවල් හොයන එක. සමහරුන්ට ඒක හීනයක්ම විතරයි. ඒ වගේම රැකියාවල නිරතවන සමහරු උසස්වීම් ගැන හීන දකිනවා. හැබැයි සුළු පිරිසක් ඉන්නවා, තමන්ගෙම කියලා ව්‍යාපාරයක් ආරම්භ කරන්න උත්සාහ කරන, ඒක වටිනා උත්සාහයක්. මොකද ඔයා කොයිතරම් උසස් රැකියාවක් කරත් ඔයා එතන සේවකයෙක් විතරයි. ඒත් ඔයාගෙම කියලා ව්‍යාපාරයක් පටන්ගත්තොත් ඒකෙ හිමිකාරයත් ඔයාමයි. පටන්ගැන්ම අපහසු වෙන්න පුළුවන්. ඒත් වටින්නේ පොඩියට හරි, හරියට පටන්ගන්න එක.

## වැඩිපුරම දක්ෂ සහ කරන්න කැමති දෙයක් පටන්ගන්න.

ඔයා යම් දෙයකට දක්ෂ නම් ඔයා ඒ කටයුත්ත කරන්නෙ හරිම කැමැත්තෙන්. සමහර විට ගතට පොඩිහරි මහන්සියක් දැණුනත් ඔයා ඒ ගැන කිසිඳු තැකීමක් කරන්නේ නැහැ. මොකද ඔයා කැමතිම දෙයක් හරිම ආසාවෙන් කරමින් ඉන්න නිසා ඔයා හරිම උද්යෝගිමත්ව ඉන්නෙ. ඒ නිසාම ඔයාට කිසිම කම්මැලි කමක් දැනෙන්නෙ නැහැ. ඒ වගේම ඒ කාර්යය වෙනුවෙන් දවසේ වැඩි වේලාවක් යොදවන්නත් ඔයාට පුළුවන් වෙනවා. බොහෝ විට ඔයාට ඒ විශය ගැන හොඳ දැනුමක් වගේම ප්‍රායෝගික පුහුණුවක් තියෙන්නත් පුළුයන්. ඒ නිසා ඔයා කැමතිම සහ දක්ෂ අංශයක් තෝරාගෙන ඒ හරහා තමන්ගේ ව්‍යාපාරයක් ආරම්භ කරන්න උත්සාහ කරන්න. ඒක අනිවාර්යයෙන්ම ඔයාගේ සාර්ථකත්වයට හේතුවේවි.



## සමාජයේ අවශ්‍යතාවය සහ ඔබේ හැකියාව ගලපන්න.

ඉස්සෙල්ලාම ඔයාගේ දක්ෂතාවය වගේම සමාජයේ අවශ්‍යතාවයන් මොනවද කියලා හිතල බලන්න. සමහර විට එකපාරටම ඒ දෙක ගලපගන්න අමාරු වෙන්න පුළුවන්. ඒත් ඒ ඔයාට හරි අදහසක් එනකන් විතරයි.

ඒ නිසා වෙලාව අරන් හොඳට හිතන්න. මෙහෙම හිතන්නකෝ, ඔයාට වගා කටයුතු වලට හොඳ අත්ගුණයක් තියෙනවා. ඒත් ඔයාට හිතෙනවා මේ වෙනකොට හැමෝම වගේ පුළුවන් විදිහට ගෙදරම වගා කටයුතු කරනවා. ඒක නිසා මට වැඩි ආදායමක් උපයන්න බැරිවෙයි කියලා. ඒ වුණත් ඔයාට පුළුවන් නම් නව ආහාරමය නිෂ්පාදනයකට භාවිතා කරන යමක් වගා කරන්න. එහෙමත් නැතිනම් විදෙස් රටවලට ආනයනය කරන්න සුදුසු යමක් වගා කරන්න, ඒක ඔයාට හොඳ ආදයම් මාර්ගයක් වේවි. මොකද ලොකයේ ආහාරමය නිෂ්පාදන සහ ස්වාභාවික සැරසිලි වලට ප්‍රමුඛත්වයක් ලබා දෙනවා.

## ඔබේ ව්‍යාපාරයට සැලැස්මක් සකසා ගන්න.

ඔයා ව්‍යාපාරකටයුතු කරන්නේ සැලැස්මකට අනුව නම් ඒක ඔයාගේ ව්‍යාපාරික ගමන්මගේ සාර්ථකත්වයට අනිවාර්යයෙන් ම හේතු වෙනවා. ඒ වගේම ඒ සැලැස්ම වෘත්තීය මට්ටමේ එකක්ම වෙන්න ඕනි නෑ. අවශ්‍ය වෙන්නෙ ව්‍යාපාර සැලැස්මකට අත්‍යවශ්‍ය සාධක ඒකට ඇතුළත් වීම විතරයි.

- නිෂ්පාදන හෝ සේවා ක්‍රියාවලිය සැලසුම් කිරීම.
- අලෙවි ක්‍රමයක් සැලසුම් කිරීම
- මූල්‍ය ගණුදෙනු හා ආරම්භක ප්‍රාග්ධනය මෙන්ම ඉලක්කගත අදායම සැලසුම් කිරීම.
- නිෂ්පාදනයේ මිල නියම කිරීම.


ආදිය ඒ සාධක අතර ප්‍රමුඛ වෙනවා. ඊට අමතරව තමන්ගේ නිෂ්පාදනය මිලදී ගැනීමට සිටින පාරිභෝගික සංඛ්‍යාව කොපමණද, ඒ වගේම ඒ නිෂ්පාදනයට වෙනත් ආදේශකයන් වෙළඳපොළට හඳුන්වාදී තිබෙනවාද සහ ඒවායෙහි ගුණාත්මකභාවය සහ මිල ගණන් පිළිබඳව සලකා බැලීම ඉතාමත් වැදගත් වෙනවා.

ඉතින් මේ කරුණු වලට අවධානය යොමු කරලා, නව කරුණු හොයාගෙන, ඔයාටත් ඔයාගේම ව්‍යාපාරයක් සාර්ථකව ආරම්භ කරන්න හැකි වේවි.



**එච්.ඩී. සලනි නිසන්සලා පද්මසිරි**
*B.Sc.Business Administration(General)Degree*


DUMINDA
GEMS
Dealer in precious & semi precious
Gem Stones
Residence:
45/1/A, Old Road,
Batugedara, Ratnapura
MR. DUMINDA SANATH POLWATTA
PROPRIETOR
0718 392 598
0778 363 300
0452 232 923
duminda324@gmail.com


CITY OF
Gems
Dealers in Genuine Gems
Mr. Ravi Abeykoon
Proprietor
0777567918


Gileemale, Ratnapura.
ඔබේ මැණිකට
ඉහළ මිලක්
චූටි මුදලාලි
Jayantha Kumara
Proprietor
077 541 9999



**මැණික් ව්‍යාපාරික**

# කේ.කරුණාදාස

(බෑනා මුදලාලි)

පියාණන්ට

උපහාරයක් වේවා !

ප්‍රධාන කර්තෘ

ගයත්‍රි කරුණාදාස

**KARUNADASA GEMS**

**LAKSHITHA VIRAJ KARUNADASA**

**0712220870**

# අහලවත් නැති භීතිකාවන් (Phobia) සහ දැනගත යුතුම Panik Attack




භීතිකා කියලා අහපු ගමන් ඕනම කෙනෙක්ට බය කියන දේ මතකයට එනවා. මොකද භීතිකාවක් කියලා කියන්නෙම කෙනෙක් යම්කිසි දෙයකට දක්වන අසීමිත බියට නිසා. උදාහරණයක් විදිහට කෙනෙක් හොල්මන්වලට බයයි, කළුවරට බයයි, සතුන්ට බයයි තවත් සමහරු ඉන්නවා උස තැන්වලට බයයි, විභාගවලට බයයි, මැරෙයි කියලා බයයි, ඒ වගේම අසාර්ථක වෙන්න බයයි. මේ වගේ තත්ත්වයන්ගෙන් සමහරක් **ෆෝබියාස් (Phobias)** කියන කාණ්ඩයට අයත් වෙනවා.

සාමාන්‍යයෙන් බොහෝ දෙනෙක් සර්පයන්ට බයයි. එකපාරට සර්පයෙක් දැක්කහම තිගැස්සිලා කැගැස්සෙන එක සාමාන්‍ය දෙයක්. ඒක කොහෙත්ම භීතිකාවක් නෙමෙයි. භීතිකාවක් කියන්නෙ සර්පයෙක් දැක්කහම පිස්සුවෙන් වගේ කෑගහන **Panik Attack** එකකින් මැරෙන්න තරම් බයවෙන එකට. ඒකට අපි සිංහලෙන් සංත්‍රාස කාංසාව කියලා කියනවා.

**Panik Attack** ගැන කතා කරන්න කලින් අපි බලමු, මොනවද අද සමාජයේ දකින්න තියෙන, ඒත් අපි අහල නැති ෆෝබියාස් (Phobias) කියලා.

## Arithmophobia - අංක භීතිකාව

අපිට එදිනෙදා කටයුතු කරද්දී අංක කියන දේ භාවිත කරන්නම සිද්ධ වෙනවා. වෙලාව බලන්න, කඩේකට ගිහින් මිලට ගන්න දේවල් වල මිල ගණන් දැනගන්න, මුදල් නෝට්ටු ගණන් කරන්න, සීනි 1Kgක මිල කිව්වහම අපිට අවශ්‍ය ප්‍රමාණයේ මිල දැනගන්න, Km වලින් දුර මැනගන්න, මේ දේවල් සාමාන්‍යයෙන් සරලයි තමයි. ඒත් සමහර පිරිසක් ඉන්නවා, අංකවලට ගොඩාක් බය වෙන. ඒකට කියන්නේ **Arithmophobia** කියලා මේ අය පොදුවේ අංකත් එක්ක ගණුදෙනු කරන්න එහෙමත් නැත්තම් අසාමාන්‍ය විදියට ගණිත විෂයට බයයි. ඒ අතර අංක දකින එක පවා මානසික වදයක් වෙන පිරිසකුත් ඉන්නවා.



## Geliophobia - හිනාව විනාසයක්

ජීවිතයට හිනාව කියන දේ ගොඩක් වැදගත් වගේම වටිනාකමක් එකතු කරනවා. කෙනෙක් ගැන තවත් කෙනෙක්ගෙ හිතේ ප්‍රසාදයක් ඇති කරවන්න මූලිකවම බලපාන දේ තමයි හිනාව. ඒ නිසාම හිනාව කියන දේ අපිට සමාජ සම්බන්ධතා සාර්ථකව පවත්වාගෙන යන්නත් උදව් වෙනවා. ඒත් Geliophobia තියෙන අය හිනාවෙන්න පුදුමතරම් බයයි. ඒ වගේ ම හිනාවෙන අය ළඟ ඉන්නත් බයයි. මේ ෆෝබියාව තියෙන අයට ඒක එක එක විදිහට බලපානවා. සමහරවිට ඒ අය හිනාවෙන්න බය නැති වුණත් වෙනත් කෙනෙක් තමන් එක්ක හිනාවෙනවට අසීමිතව බය වෙන්න පුළුවන්.

## Decidophobia - තීරණයක් ගන්න බයයි.

එදිනෙදා ජීවිතයේ දී සරල වගේම සංකීර්ණ තීරණත් ගන්න සිද්ධ වෙනවා. උදාහරණයක් විදිහට මෙහෙම හිතන්නකො, අපට කොහේහරි යන්න ඕනි වුණාම, ඒ ගමන යනවද? නැද්ද? අදම යන්න ඕනිද? මොකද්ද ඇඳගෙන යන්නේ? එහෙමත් නැත්තම් අද රෑට කන්නෙ බත්ද? පාන්ද? මේ වැඩේ අද කරනවද? හෙට කරනවද? මේවා තමයි අපි සාමාන්‍යයෙන් එදිනෙදා ජීවිතයේ දී ගන්න සරල තීරණ. ඒ වගේම උසස්පෙළට මොනවද කරන්නෙ? රස්සාවක් කරනවද? ව්‍යාපාරයක් කරනවද? දැන්ම විවාහ වෙනවද? නැද්ද? අන්න ඒ වගේ ඒවා සංකීර්ණ තීරණ. ඒත් Decidophobia තියෙන අය තීරණ ගන්න බයයි. මොකද ඒ අයට තමන් ගැන සහ තමන්ගෙ තීරණ ගැන විශ්වාසයක් නැහැ. සමහරවිට ඒ අයට සරල තීරණ ගන්න පුළුවන් වුණත් සංකීර්ණ තීරණ ගන්න බැහැ. ඒක නිසා ඔවුන් තමන් වෙනුවෙන් තීරණ ගන්න වෙනත් කෙනෙකුට භාර දෙනවා. එහෙමත් නැතිනම් ජ්‍යොතිෂය, සාස්තර වගේ දේවල් මත තමන්ගෙ තීරණ පදනම් කරනවා.

## Synenesophobia - නෑයෝ නම් වේයෝමයි.

අපි හැමෝටම නෑදෑයෝ ඉන්නවනේ. මේ ෆෝබියාව ඇති වෙන්නෙ අන්න ඒ නෑදෑයෝ සම්බන්ධව. අම්මගෙ අක්කා, තාත්තගෙ මල්ලි, නැන්දගෙ පුතා, බාප්පගෙ දුව, සීයගෙ මල්ලිගෙ දුවගෙ දුව ඔන්න ඔය විදිහෙ අපිට ළඟ වගේම දුර නෑදෑයෝත් ඉන්නවා. අපි නිකන් කතාවටත් කියනවනෙ නෑදෑයෝ නම් මහ ලෙඩක්, කරදරයක් කියලා. ඒක සාමාන්‍යයි. ඒත් මේ ෆෝබියාව තියෙන අය නෑදෑයන්ට අසීමිතව බයයි. ඒ කියන්නෙ ඒ අය මුණගැහෙනවට, කතාකරනවට, සම්බන්ධතා පවත්වනවට ඔවුන් අසීමිතව බයක් දක්වනා.




**වෛද්‍ය එන්. කුමාරනායක**
*Professional Clinical Psychiatrist*
*Government Based Hospital*


## Nomophobia - ෆෝන් එක මගේ ජීවිතේ

දැන් කාලේ පොඩි ළමයින්ගේ අතෙත් **smart phone** එකක් තියෙනවා. කන්න ගියත්, නාන කාමරයට ගියත් **phone** එක අතේමයි. නිකමට හිතන්නකො **phone** එක කැඩිලා, හදන්නත් දවස් දෙක තුනක් යනවා කියලා. එතකොට මොකක් වෙයිද? **Fb, YouTube, WhatsApp** යන්න බැහැ. කොටින්ම **Social media** වලින් අනිත් අයත් එක්ක සම්බන්ධ වෙන්න බැරුව යනවා. අත්‍යවශ්‍ය දේවල් වෙනුවෙන් **Phone** එක පාවිච්චි කරන කෙනෙක්ට ඒක ඒ තරම් ප්‍රශ්නයක් නොවුණත් **Nomophobia** තියෙන අයට නම් **phone** එකේ **Battery** බැස්සත් දැඩි මානසික ආකූලතාවයක් දැනෙනවා. මේ තත්ත්වය ඇති වෙන්නේ **Phone** එකය ඇබ්බැහි වීමෙන් කියලා තමයි අහන්න ලැබෙන්නෙ.

## Panik Attack එකක් කියන්නේ මොකක්ද?

ගොඩක් වෙලාවට මේ තත්ත්වය ළමා කාලයේ දී මුහුණ දුන්න අත්දැකීම් හේතුවෙනවා. ඒ අත්දැකීම් නිසා අපි වටා බිය සහගත තත්ත්වයන් රාශියක් එකතු වුණොත් ඒ තත්ත්වය උග්‍ර වෙන අවස්ථාවක් එනවා. ඒ වෙලාවට ඇතිවෙන බයට ප්‍රතිචාර දක්වන්න බැරුව වික්ෂිප්ත වෙනවා. ඒකට අපි කියනවා **Panik Attack** එකක් කියලා.

## Panik Attack එකක් හඳුනාගන්නෙ කොහොමද?

පළවෙනි වතාවට **Panik Attack** එකකට මුහුණ දෙන කෙනෙක්ට දැනෙනවා එයාගෙ හදවත වේගයෙන් ගැහෙනවා කියලා. ඒ වගේම හදවත ගැහිලා ගැහිලා නතරවෙයිද? එහෙමත් නැත්නම් හදවත එළියට පනියිද? වගේ හැඟීමක් ඇතිවෙනවා. මුළු ඇඟම දහදියෙන් තෙත් වෙනවා. ක්ලාන්ත වෙනවා. ඇස් නිලංකාර වෙනවා. ඇඟම පණ නැතිවීගෙන යනවා. ඒ වගේම සමහර වෙලාවට මනසයි ශරීරයයි වෙන් වෙනවා වගේ දැනෙනවා. ඒ වගේ වෙලාවට එයාට හිතෙනවා පිස්සු වැටෙන්න යනවා නැත්නම් මං මගේ අවසානෙට ළං වෙලා ඉන්නේ. මම මැරෙන්න යන්නේ. මම ඉවරයි වගේ ලොකු භීතිකාවක් ඇතිවෙනවා.

## Panik Attack එකක ආවොත් කරන්න ඕනි මොනවද?

**Panik Attack** එකකින් මිදෙන්න අපිට තනිවම කරන්න පුළුවන් එකම සහ හොඳම දේ තමයි පුළුවන් තරම් හිත ශක්තිමත් කරගෙන මානසිකව හිත නිදහස් කරගෙන ශරීරය ඉහිල් කරන එක. ඒත් මේ තත්ත්වයෙන් සම්පූර්ණයෙන්ම මිදෙන්න නම් මනෝ වෛද්‍යවරයෙක්ගෙන් මානසික උපදෙස් සහ ප්‍රතිකාර ලබා ගන්න එක වැදගත්. එහෙමත් නැතිනම් මනස සැහැල්ලු කරන භාවනා ක්‍රම උපයෝගී කර ගැනීමත් මෙයට හොඳම බෙහෙතක් වෙනවා.



# රුවන්පුර චාරිකා
## Trips to Ruwanpura

කොළඹ සිට කිලෝමීටර් 100ක් පමණ ගිණිකොන දෙසින් පිහිටා ඇති රත්නපුර නගරය ශ්‍රී ලංකාවේ මැණික් වෙළඳ මධ්‍යස්ථානය ලෙසින් නම් දරයි. “රත්න” යන්නෙන් මැණික් යන අදහසත් “පුර” යන්නෙන් නගරය යන අදහසත් ඇතිව රත්නපුරය යන නාමය සැදී ඇත. මැණික් වලට අමතරව තවත් බොහෝ ස්වභාවික සම්පත් වලින් අනූන රත්නපුර දිස්ත්‍රික්කය ඓතිහාසික වටිනාකමක් සහිත සුවිශේෂී නගරයකි. පුරාවිද්‍යාත්මක ගවේෂණයෙහිලා රත්නපුරය ඉතා ප්‍රචලිතය. එමෙන්ම මෙම ප්‍රදේශය තේ, කුරුඳු සහ රබර් වගාවලින් වට වුණු අලංකෘත පරිසරයක් සහිත සශ්‍රික වැවිලි කර්මාන්තයකට හිමිකම් කියන ප්‍රදේශයකි.

### කන්නෙලිය වැසි වනාන්තරයේ ඉතිහාස කතාවෙන් බිඳක්

සියවස් ගණනාවක් ඈතට දිව යන කන්නෙලිය වැසි වනාන්තරයේ ඉතිහාස කතාවෙහි සඳහන් වන පරිදි එහි ආදිවාසීන් ජීවත් වූ බව කියැවේ. එමෙන්ම ස්වාභාව ධර්මයට හිතැතිව ජීවත්වූ ඔවුන් එහි පරිසරයට කිසිදු ආකාරයේ හානියක් නොවන පරිදි එහි සම්පත් පරිභෝජනය කරමින් තම ජීවිකාව ගෙනගිය බවද සඳහන් වේ.





නමුත් ලන්දේසීන් විසින් 18 වන සියවසේදී ශ්‍රී ලංකාව අත්පත් කරගන්නවාත් සමඟම කන්නෙලිය වැසි වනාන්තරයෙහි ස්වාභාවික සම්පත් සූරාකෑමට ලක්වන අතර එමඟින් එහි මහා පරිමාණයේ දැව කැපීම් සහ වෙනත් ආකාරයේ සූරාකෑම් රැසක් සිදු වී ඇත. කෙසේ නමුත් බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ දී (1948 ශ්‍රී ලංකාව නිදහස ලැබීමට පෙර) කන්නෙලිය වැසි වනාන්තරය රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඉන් පසුව එහි ආරක්ෂාව පිළිබඳ කටයුතු කළද නීති විරෝධී දැව කැපීම් සිදු වූ බව සඳහන් වේ.

පසු කාලයක දී කන්නෙලිය වැසි වනාන්තරය පමණක් නොව තවත් වනාන්තර කිහිපයක්ම ආරක්ෂා කිරීමට කටයුතු සිදු කළ බව කියැවේ. එපමණක් ද නොව 2004 දී යුනෙස්කොව විසින් කන්නෙලිය වැසි වනාන්තරය ජෛව ගෝල රක්ෂිතයක් බවට පත්කිරීමට කටයුතු කර ඇත. කැපී පෙනෙන ජෛව විවිධත්වයකින් සහ විවිධ ශාක සහ සත්ත්ව විශේෂයන්ගෙන් මෙම වනාන්තරය සමන්විත වීම ඊට හේතු සාධක ලෙස දක්වා ඇත.





ඒ නිසාම මේ වන විට කන්නෙලිය වැසි වනාන්තරය සංචාරකයින්, පර්යේෂකයින් සහ සොබාදහමට හිතැති මිනිසුන් අතර ප්‍රසිද්ධ සංචාරක ස්ථානයක් බවට පත්වී ඇත. එමඟින් ඔවුන් විවිධ ශාක සහ සත්ත්ව විශේෂයන් පිළිබඳව ඉගෙන ගන්නටත්, එහි පිහිට කඳු ගවේෂණය කරන්නටත්, එහි ඉතිහාසය පිළිබඳව පර්යේෂණ කරන්නටත් යොමු වී ඇත. එමෙන්ම සංචාරක ව්‍යාපාරයක් බවට පත්කර ගනිමින් එම ප්‍රදේශ වැසියන් සංචාරක ව්‍යාපාරය වෙත යොමු කරවන්නට මේ වනවිට කටයුතු කෙරේ.


## බටදොඹ ලෙන

පුරාවිද්‍යා භූමියක් ලෙස හැඳින්වෙන බටදොඹ ලෙන ලෙන් විහාරය ක්‍රි.පූ.8000 ක් පමණ ඉපැරණි ඓතිහාසික භූමියකි. මෙම ගුහාවේ තිබී දකුණු ආසියාවේ නූතන මානව ජීවීන් පිළබඳ ප්‍රමුඛතම ප්‍රාථමික පොසිලය ද සොයා ගත් බව පුරාවිද්‍යාත්මක තොරතුරු වලින් අනාවරණය වී ඇත. මෙහි පළමු කැණීම සිදු කර ඇත්තේ ශ්‍රී ලංකා කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය පී.ඊ.පී. දරණියගල මහතා විසිනි. ඒ 1938 දී බව සඳහන් වේ. ඉන්පසුව ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට ගම්වාසීන්ගෙන් ලැබුණු තොරතුරු මත තවත් කැණීම් කිහිපයක් සිදු කළ බව කියැවේ.

විශාල ලෙන, කුඩා ලෙන ලෙසින් ලෙන් දෙකකින් යුක්ත වන බටදොඹ ලෙන මීටර් 78ක් පමණ උසැති යෝධ පර්වතයක් මත පිහිටා ඇත. ආසන්න වශයෙන් එම පර්වතය මීටර් 500ක් පමණ භූමි ප්‍රමාණයක පිහිටා ඇති අතර එය ලෙන් පෙළකින් සමන්විත වේ. ඒවායින් කෙළවරේම පිහිටා ඇති ලෙන් දෙක අනෙකුත් ලෙන් වලට වඩා සුවිශේෂීය.

බටදොඹ ලෙනෙහි දකුණත පිහිටා ඇති ගුහාව එහි ඇති විශාලතම ගුහාව වන අතර එය දිගින් මීටර් 28කි. එහි මුහුණත පළල මීටර් 12ක් සහ පිටුපස පළල මීටර් 8ක් ලෙස සඳහන් වේ. එමෙන්ම මහලෙන තුළ 1000කට වඩා වැඩි පිරිසකට වූවත් එකවර සෙවණ ලබන්නට හැකි තරම් ඉඩකඩ පවතියි.

එමෙන්ම එහි 1979, 1980 සහ 1981 යන වර්ෂයන්හි දී කරන ලද කැනීම් මෙහෙයවන ලද්දේ ආචාර්ය එස්.යූ මහතා විසිනි. ඒ කැනීම් වලදී කුඩා ලෙනෙහි වම්පස බිත්තියේ තිබී කාන්තාවකගේ පොසිල ඇට සැකිල්ලක් සහ ගල් යුගයේ ජීවත් වූ මිනිසුන් භාවිත කළ මෙවලම් කිහිපයක්ද සොයා ගෙන ඇත. ඒ වන විට පුරාවිද්‍යා සහකාර කොමසාරිස් තනතුරෙහි දරණියගල මහතා සිටි බව සඳහන් වේ.




modern
SALON FURNITURE (PVT) LTD
No. 01 Manufacturing Company in Sri Lanka
Stylish & Elegant
SALON FURNITURE
COLLECTION
ඔබට අවශ්‍ය සියලුම
සැලෝන් භාණ්ඩ හා උපකරණ
එකම වහලක් යටින් මිලදී ගන්න
★ ඉහළ පාරිභෝගික විශ්වාසය ★
★ ගුණාත්මක භාණ්ඩ හා හොඳම මිල ★
★ පේටන්ට් බලපත්‍රලාභී අපේම රටේ සමාගමක් ★
★ වසර 25කට ආසන්න කාලයක් ක්ෂේත්‍රයේ පළපුරුද්ද ★
www.modernsalonfurniture.lk
077 753 5106 | 071 683 3884
Kandy | Matara | Negombo | Kurunagela | Kohuwala | Ratnapura | Kiribathgoda
0703326007 0703326006 0710326005 0710326001 0710326003 0713326009 0702266008
Canada - Vancouver

# හෙයාර් කලර් එකක් කරන්න ආසද?
## ඊට කළින් දැනගන්න ඕන දේවල් ගැනයි මේ



ඉස්සර නම් කොණ්ඩෙ පාට කළේ නරකෙස් පේන්න ගන්නකොට. දැන් නම් එක එක වර්ණ වලින් කොණ්ඩෙ පාට කරන්නෙ විලාසිතාවට. ඉස්ස ඉස්සෙල්ලාම හෙයා කලර් එකක් කරන කෙනෙක් දැනගෙන ඉන්න ඕන දේවල් ටිකක් තියෙනව. ඔයා දැනටත් හෙයා කලර් එකක් කරපු කෙනෙක් උනත් මේ ටික කියවල බලන එකේ පාඩුවක් නෑ. හෙයා කලර් එකකට පස්සෙ කොණ්ඩය කොහොමද පරිස්සම් කරගන්නෙ කියලත් දැනගන්න පුළුවන්.

### ඔබ සහ ඔබේ සම

හෙයා කලර් එකක් හිතුණ ගමන් කරන්න එපා. මුලින්ම ඔයා රැකියාවක් කරනව නම් ඔයාගෙ රැකියාවේ ස්වභාවය, ගැවසෙන සමාජය සහ ඔයාගෙ පෞර්ෂය ගැන හිතල කලර් එකක් තීරණය කරන්න ඕන. වයිබ්‍රන්ට් එහෙම නැත්නම් කැපී පෙනෙන වර්ණ හැමෝටම ගැලපෙන්නෙ නෑ ආස උනත්. අනිත් කාරණය සමේ වර්ණයේ ස්වභාවය. ආසියාතික අපේ සම බොහෝ විට කහ පැහැයට හුරු, එහෙම නැත්නම් වෝම් (Warm) ස්කින් ටෝන් එකක්. රතට හුරු කූල් (Cool) ස්කින් ටෝන් එකක් තියෙන අයත් නැතුවම නෙවෙයි. ඔයාගෙ සමේ වර්ණය කූල්ද නැත්නම් වෝම්ද කියන එක මත කොණ්ඩෙට පාවිච්චි කරන කලර් එක තෝරගන්න. සමේ පැහැය අඳුරු කරවන පාටක් නැතුව සම දීප්තිමත්ව පෙන්වන වර්ණයක් තෝරගන්න එතකොට පුළුවන්.

### තෝරාගන්න වර්ණය සහිත පින්තූරයක්

සැලෝන් එකට යනකොට ඔයා ගාන්න හිතන් ඉන්න වර්ණය සහිත පින්තූරයක් අමතක නොකර අරන් යන්න. අපි කටින් කියන පාට සමහරවිට සැලෝන් එකේ කෙනාට මැවෙන පාට නොවෙන්න පුළුවන්. වඩාත්ම සුදුසු කරන්න හිතන් ඉන්න කලර් එකේ ෆොටෝ එකක් අරන් යන එක.

### කොණ්ඩය සෝදගෙන යන්න

සැලෝන් එකට යන්න කලින් හොඳින් හිසකෙස් ෂැම්පූ කරල සෝදගෙන යන්න. කන්ඩිශනර් පාවිච්චි කරන්න එපා. වෙනින් වැඩක් අතරතුර සැලෝන් එකට යනව නම් කලර් එකට කලින් හිසකෙස් සෝදන්න කියල මතක් කරන්න අමතක කරන්න එපා. අපේ හිස්කෙස් වල ස්වභාවයෙන්ම ඇති තෙල් ගතියත්, ඒ මත ඇති දූහුවිල්ලත් තියෙද්දි කලර් එකක් කළොත් හරියට වර්ණය අල්ල නොගන්න ඉඩ තියෙනව.

### ලාස්ට් බට් නොට් ද ලීස්ට්

කලර් එකක් කරන්න යන ගාණ තීරණය වෙන්නෙ ඔයාගෙ කොණ්ඩයේ දිග, ඝණකම සහ පාවිච්චි කරන නිෂ්පාදනයේ බ්‍රෑන්ඩ් එක අනුව. එක පාරටම සැලෝන් එකකට ගිහින් කලර් එකක් කරගන්න කලින් අවශ්‍යතාවය ගැන කියල ගණන් මිනුම් දැනගෙන බජට් එක හදාගන්න.

### ස්කින් ඇලර්ජී

සමහරුන්ට මේ පාවිච්චි කරන කෙමිකල්ස් වලට ආසාත්මිකතා එහෙම නැත්නම් ඇලර්ජීස් එන්න පුළුවන්. පළවෙනි පාරට කලර් කරන කෙනෙක් නම් අනිවාර්යයෙන් ස්කින් ටෙස්ට් එකක් කරගන්න ඕන. සැලෝන් එකකින් කරගන්නව නම් කලින් දවසෙ ගිහින් කණ පිටුපස සමේ ඒ වර්ණයෙන් ස්වල්පයක් තවරගෙන එන්න. පැය 24ක් ඇතුලත ආසාත්මිකතාවයක් උනේ නැත්නම් බය නැතුව වර්ණ ගන්වන්න පුළුවන්. සමහරුන්ට මේ පාවිච්චි කරන කෙමිකල්ස් වලට ආසාත්මිකතා එහෙම නැත්නම් ඇලර්ජීස් එන්න පුළුවන්. පළවෙනි පාරට කලර් කරන කෙනෙක් නම් අනිවාර්යයෙන් ස්කින් ටෙස්ට් එකක් කරගන්න ඕන. සැලෝන් එකකින් කරගන්නව නම් කලින් දවසෙ ගිහින් කණ පිටුපස සමේ ඒ වර්ණයෙන් ස්වල්පයක් තවරගෙන එන්න. පැය 24ක් ඇතුලත ආසාත්මිකතාවයක් උනේ නැත්නම් බය නැතුව වර්ණ ගන්වන්න පුළුවන්..

### ලයිට් කලර්ස් සහ ඩාර්ක් කලර්ස්

බ්ලොන්ඩ් කලර්ස් එහෙම නැත්නම් ලා වර්ණ වලින් හිසකෙස් හයිලයිට් කරනවා නම් බ්ලීච් කරන්න සිද්ධ වෙනව. හිසකෙස් බ්ලීච් කරන එක නම් නිරෝගී කොණ්ඩයකට ඒ තරම්ම හොඳ දෙයක් නෙවෙයි. හිසකෙස් වලට හානි සිදුවෙන්න පුළුවන්. ඩාක් කලර්ස් වලින් වර්ණ ගන්වනකොට එහෙම ගැටළුවක් ඇති වෙන්නෙ නෑ. බ්ලීච් නොකරම වර්ණ ගන්වන්න පුළුවන්.

### හිසකෙස් වල වොලියුම් එක අඩු නම්

කොණ්ඩයේ වොලියුම් එක එහෙම නැත්නම් ඝණ බව අඩු කෙනෙක්ට හෙයා කලර් එකකදී පොඩි ඇස්බැන්දුමක් කරන්න පුළුවන්. වර්ණ දෙකක ශේඩ්ස් පාවිච්චි කරල හයිලයිට් එකක් කරනව නම් හෙයා වොලියුම් එක වැඩි කරල පෙන්වන්න පුළුවන්.



මනෝපී තක්ෂිලා ජයසේන
N.V.Q Level 4
Salon Sandaru


### විවෘත වෙන්න, කතා කරන්න

කා එක්කවත් නෙවෙයි මේ කිව්වෙ කොණ්ඩය කලර් කරන කෙනා එහෙම නැත්නම් ඔයා යන සැලෝන් එකේ කෙනා එක්ක කතා කරන්න. තමන්ගෙ අවශ්‍යතාවය හරියට සන්නිවේදනය කරන්න. කොණ්ඩයට මොන වගේ පෙනුමක්ද අවශ්‍ය, තමන් කැමති වර්ණය, හෙයා කට් එකකුත් කරනවද නැද්ද, හිසකෙස් වල ස්වභාවය, බ්ලීච් කරනවට කැමතිද අකමැතිද කියන එක වගේ හැමදෙයක් ගැනම කතා කරන්න. ගැටළු තියෙනව නම් අහල දැනගන්න. පාවිච්චි කරන කලර්ස් වල බ්‍රෑන්ඩ් එක මොකක්ද කියන එකත් අහන්න අමතක කරන්න එපා. හැමවිටම තත්ත්වයෙන් හොඳ නිෂ්පාදන පාවිච්චි කරන එකෙන් හිසකෙස් වලට වෙන හානිය අවම කරගන්න පුළුවන්.

### කලර් කළාට පස්සෙ

- හෙයා කලර් එකක් කළාට පස්සෙ මෙච්චර දවස් පාවිච්චි කරපු ෂැම්පූ එකයි කන්ඩිෂනර් එකයි පැත්තකට දාන්න වෙනව. කලර් ප්‍රොටෙක්ශන් ෂැම්පූ එකක් සහ කන්ඩිෂනර් එකක් පාවිච්චි කරන එකෙන් වර්ණය වැඩි කාලයක් පවත්වගන්න පුළුවන්.
- අව්වට හිසකෙස් නිරාවරණය කරන එක හැකි තරම් අඩු කරන්න. සිලිකන් ඔයිල් හෝ ලීව් ඔන් කන්ඩිෂනර් එකක් පාවිච්චි කරන එක වඩාත් සුදුසුයි.
- පූල් වල බහින්නෙ කල්පනාවෙන්. පූල් වලට පාවිච්චි කරන ක්ලෝරීන් හෙයා කලර් එකක් ෆේඩ් කරන්න සමත්. නිතර ස්විමින් කරන කෙනෙක් නම් හෙයා මාස්ක් එකක් පාවිච්චි කරන එක සුදුසුයි.

### ආයෙ කලර් කරන්න ඕන කොච්චර කාලෙකින්ද?

වර්ණ ගැන්වූ ස්ටයිල් එක අනුව සති 6-8ත් අතර කාලෙකින් නැවත හෙයා කලර් එකක් කරන්න තියෙන ඉඩ වැඩියි. උදාහරණයක් විදියට බ්ලොන්ඩ් හයිලයිට් එකක් කළා නම් මාසෙකට අනිවාර්යයෙන්ම වැවෙන හිසකෙස් වල අහල් භාගය බ්ලොන්ඩ් එක නැතුව කැපිල පේන්න ගන්නව. ඔයා බලාපොරොත්තු වෙන පෙනුම ඒකෙන් නැති වෙන්න පුළුවන්. ස්වභාවික හිසකෙස් වල වර්ණයත් එක්කම ශේඩ් වෙන පාටකින් කලර් කලා නම් මාස හයකට වතාවක් කලර් කරන කාලය දික් කරගන්න පුළුවන්.



# MAHINDA GEMS

**MAHINDA KEERTHI**
Proprietor

No . 25, Colin Crescent
Ratnapura

076 713 60 90





AJC
GEMS
Mr. AMILA
Proprietor
077 7492134


CJ
Mr. C.J. MAHAGAMAGE
Proprietor
077 2527290
DEMUWAWATHA, RATNAPURA


gems
Mr. ROOPASINGHE
Proprietor
076 8467002
PALAWELLA, RATNAPURA


KVS
KAVITHAS
NEW KAVITHAS
GENERAL MERCHANTS, WHAL SALE & RENTAIL
045 222 3783
PHOTHGUL VIHARA MAWATHA, RATNAPURA


WADAGALA
GEMS
Mr. S.W. BANDARA
Proprietor
NIVITHIGALA
072 2235324

# ස්වෝත්සාහයෙන් දියුණු වෙන්න කැමති ඔයාට

ස්වෝත්සාහයෙන් දියුණු වෙලා ලොකු නමක් දිනාගත්තු පුද්ගලයෝ ගැන අපි අහල තියෙනවා. ඒ අයගෙන් නවලෝක මුදලාලි, සිද්ධාලේප මුදලාලි, නිකාඩෝ මුදලාලි(දයානන්ද ගුණවර්ධන) කියන්නෙ ලංකාවෙ ප්‍රමුඛ ව්‍යාපාරිකයො බවට පත්වෙච්ච අය. ජාත්‍යන්තරයේ ද ව්‍යාපාරලෝකය ජයගත්තු පුද්ගලයෝ බොහොමයක් ඉන්නවා. මාර්ක් සකර්බර්ග්, ජෙෆ් බෙසෝස්, බිල් ගේඩ්ස් කියන්නේ ස්වෝත්සාහයෙන් බිලියනපතියන් වුණ අති දැවැන්තයින්. ඉතින් ඒ වගේ පුද්ගලයින්ව දකිනකොට ඒ අය ගැන ඇහැනකොට ඔයාටත් හිතෙන් නැද්ද කොහොමහරි ඒ වගේ දියුණු වෙන්න ඕනි කියලා? ඒ වෙනුවෙන් ඔයා කරන්න ඕනි මොනවද? කරන්න ඕනි කොහොමද? කියලා ඔයාට තේරෙනව නම්, දැන්ම පටන්ගන්න. ඒ වැඩටික කරන්නෙ ඔයාගෙ ගෙදර ගැරේජ් එකේ ඉඳන්ද? නැත්නම් කුස්සියේ ඉඳන්ද? කියන එක අදාල නෑ. වෙන්න ඕනි ඔයා පටන්ගත්තු වැඩ ටික වෙහෙස මහන්සි වෙලා හරියට කරන එක විතරයි. එහෙම වුණොත් දවසක බිලියනපතියෙක් වෙන්න ඕනි කියලා දකින හීනෙ හැබෑ කරගන්න පුළුවන්.



## වර්ක් හාර්ඩ් සහ වර්ක් ස්මාර්ට්.

වර්ක් හාර්ඩ් වර්ක් ස්මාර්ට් ගැන දැන් දැන් නිතරම වගේ අහන්න ලැබෙනවා. වැඩි දෙනෙක් වර්ක් ස්මාර්ට් වලට වැඩි අවදානයක් දෙනවා. ඇත්තටම වඩාත් වැදගත් වෙන්නේ වර්ක් හාඩ්ද? වර්ක් ස්මාර්ට් ද? කෙනෙක් අඩු වෙලාවකින් උපරිම වැඩ කොටසක් කරලා රැකියා දිවියේ සමබරතාවය රැකගන්න උත්සහ කරනවා නම් එයා වර්ක් ස්මාර්ට් ගැන දැනගන්න එක ගොඩක් වැදගත්. ඒත් කොච්චර ස්මාර්ට් වුණත් වැඩක් නැහැ තමන්ගෙ අරමුණ වෙනුවෙන් මහන්සි වෙලා වැඩක් කරන්නෙ නැත්තම්. උදාහරණයකට අපි මෙහෙම හිතමු. දක්ෂ අත්කම් නිර්මාණ ශිල්පියෙක් ඉන්නවා. එයා අත්කම් නිර්මාණ ක්‍රම කිහිපයක් තෝරාගෙන ඉතා අලංකාර නිර්මාණ කරනවා. ඒ සඳහා එයාට හොඳ හැකියාවකුත් තියෙනවා. ඒ වගේ එයා තමන්ගේ කාලයෙන් උපරිම ප්‍රයෝජනය අරගෙන මහන්සි වෙලා වැඩත් කරනවා. ඒ කාර්යක්ෂමතාවය නිසාම එයාට විවේකීව ඉන්නත් කාලය ඉතිරි වෙනවා. ඒ වගේම හොඳ මුදලකුත් අතට ලැබෙනවා. එතකොට ඒකටද වර්ක් ස්මාර්ට් කියන්නේ? කොහෙත්ම නැහැ. වර්ක් ස්මාර්ට් කියන්නේ කාර්යක්ෂමව දක්ෂ ලෙස වැඩ කරන, බැලූ බැල්මට ස්මාර්ට් වර්කර් කෙනෙක් වගේ පේන එකට නෙමෙයි. ස්මාර්ට් වර්ක් කියන්නෙ ඊට එහා ගිය දෙයක්. එයා දන්න අත්කම් නිර්මාණ ක්‍රම දෙක තුනෙන් එහාට ගිහින් එයාට පුළුවන් වෙන්න ඕනි අලුත් නිර්මාණ කරන්න. අත්කම් නිර්මාණ ශිල්පයට කොටු නොවී තමන්ගෙම කියලා අලුත් නිර්මාණ හඳුන්වලා දෙන්න. මුදල් උපයනවට අමතරව තමන්ටම කියලා නමක් හදාගන්න. අනන්‍යතාවක් ගොඩනගාගන්න එයාට පුළුවන් වෙන්න ඕනි. අන්න එහෙම අයට පුළුවන් ලෝකයේ බිහිවුණු විශිෂ්ටයින් අතරට තමන්ගේ නමත් අරගෙන යන්න. ස්වෝත්සාහයෙන් දියුණු වුණු හැමෝම ඒ වගේ අය තමයි. ඔයාටත් ඒ වගේ හීනයක් තියෙනව නම් මේක හොඳට මතක තියාගන්න. එතෙන්ට යන්න නම් වර්ක් හාර්ඩ්, වර්ක් ස්මාර්ට් කියන දෙකම එක වගේ වැදගත්.

## කාලය රන් හා සමානයි.

මේක අපි පුංචි කාලේ ඉඳලම අහලා තියෙන, තාමත් අහන බොහොම ප්‍රසිද්ධ කියමනක්. ඒත් ඒ කියමනේ සැබෑ අර්ථය, වටිනාකම තේරෙන්නෙ අද. සමහරුන්ට ඒකත් නැහැ. අපිට දවසකට තියෙන්නෙ පැය 24යි. ඒකෙනුත් අපි පැය 6ක් නිදා ගන්නවා. එතකොට පෞද්ගලික වැඩකටයුතු වලටයි, විවේකයටයි කාලය වෙන්කරහම අපිට වැඩ කරන්න ඉතුරු වෙන්නේ පැය 10ක් වගේ බොහොම පුංචි කාලයක්. කෙනෙක් තමන්ගෙ හීනය සැබෑ කරගන්න අවංකවම මහන්සියෙන් කාලය උපරිම ප්‍රයෝජනයට අරගෙන වැඩ කරනවනම් අන්න ඒ කෙනාට තේරෙනවා කාලය කා දමන එක කොච්චර පාඩුවක් ද කියලා.



## මුල අමතක කරන්න එපා. අතීතෙට බැඳෙන්න එපා.

ඔයාට, ඔයාගෙ මුල මතක තියෙන එක දියුණුවට වගේම පැවැත්මටත් ගොඩක් බලපානවා. දැන් ඔයා ඉන්නේ පොල් අතු පැලකද? නැත්නම් ඉස්සර පොල් අතු පැලක ඉඳලා දැන් ස්මාර්ට් හොම් එකක අයිතිකාරයෙක් වෙලා තමන්ගෙ ඉතුරු ඉලක්ක වලට වැඩ කරන කෙනෙක් ද? ඒ කොහොම වුණත් ඔයා මුල අමතක කරන්න එපා. ඒ වගේම තමන් යන ගමනට වඩා ලෙහෙසියෙන් පහසුවෙන් යන අයත් එක්ක ඇරියස් තියාගෙන තමන් ගැන හීනමානයකින් ඉන්නත් එපා. මොකද එකෙන් වෙන්නේ තමන්ගෙ ගමනට බාධා වැඩි වෙන එක විතරයි.

## ඔයාගේ දියුණුවට අත දෙන මිනිස්සු ළං කරගන්න.

තමන් විසින් දියුණු වෙන එකට කියන්නේ ස්වෝත්සාහයෙන් දියුණු වෙනවා කියලා. ඔයත් එහෙම දියුණු වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්න කෙනෙක් නම් ඔයා අනිවාර්යයෙන්ම දැනගන්න ඕනි දෙයක් තියෙනවා. ස්වෝත්සාහයෙන් දියුණු වෙනවා කියනකොටම ඔයාට තනියම දියුණු වෙනවා කියන අදහස ඇති වෙන්න පුළුවන්. ඒත් ඔයා හිතන්න එපා, ඔයාට කාගෙවත් උදව්වක් ඕනි වෙන්නෙ නෑ කියලා. මොකද ඔයාගෙ හිතවතුන්ගෙ උදව් උපකාර ඔයාට ගොඩක් වටිනවා. ඒ අයගෙත් අවවාද සහ මඟපෙන්වීම් ඔයාගෙ ගමනට ලොකු ශක්තියක්. හැබැයි බොරු හිතවත්කම් පෙන්නගෙන ඔයාගෙ ගමනට බාධා කරන්න එන අයගෙන් ඈත් වෙන්නත් ඔයා දක්ෂයෙක් වෙන්න ඕනි.

## තමන්ගෙ දෙයක් පටන් ගන්න ඇයි බයවෙන්නේ?

මාසික වැටුපක් සහිත රැකියාව වඩාත් ආරක්ෂිතයි කියන එක ගොඩක් අයගෙ මතයක්. තමන්ට පැවරුණු රාජකාරිය අවංකව කරොත් රැකියාව සුරක්ෂිතයි කියන එක ඔවුන් දන්නවා. ඒත් ස්වොත්සාහයෙන් දියුණු වෙන්න නම් ඔයා අනිවාර්යයෙන්ම තමන්ගෙ දෙයක් පටන්ගන්න ඕනි. ඒකෙ අවදානමක් තියෙන්න පුළුවන්. ඒත් ස්වෝත්සාහයෙන් දියුණු වෙන කෙනා ඒ අවදානමට බය නැහැ. මේ දේවල් වලින් කියන්නෙ නෑ තවත් කෙනෙක් යටතේ වැඩ කරන එක වැරැද්දක් කියලා. ඒකත් සේවාවක්. ඒත් තමන් කොච්චර මහන්සි වුණත් අවසාන ප්‍රතිඵලයේ උපරිමය භුක්ති විඳින්න ඔයාට අවස්ථාවක් නැහැ. ඒත් ඔයාගෙම දෙයකින් ඔයාට ඒ සතුට ලබාගන්න පුළුවන්. ඒක නිසා තමන්ගෙම කියලා අලුත් දෙයක් පටන් ගන්න. බයවෙන්න එපා. මොකද ඔයාටත් අනිවාර්යයෙන්ම දිනන්න පුළුවන්.

**ඩී.පී. අතුකෝරලගේ**
විශ්‍රාමික කර්නල්
අධ්‍යාපන අධ්‍යන (DA)
යුධහමුදා විද්‍යාපීඨය





වසර 22ක් පුරා විවිධ වයස් මට්ටම් වල දරුවන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම වඩා වර්ධනය කරනුවස් ජාත්‍යන්තර පාසල් ක්ෂේත්‍රයේද, පෞද්ගලික අධ්‍යාපන ආයතනයක නිර්මාතෘ ලෙසද විශ්ව විද්‍යාල ආචාරවරියක ලෙසත් අවුරුදු 16ක පමණ විවිධ පීඨ වෙත ඉංග්‍රීසි භාෂාව උගන්වා ලත් පරිචයෙන්ද ආචාරවරියක ලෙස ශ්‍රී ලාංකික සිසු දරුවන්ට විධිමත් ඉංග්‍රීසි අධ්‍යාපනයක් ලබා දීමේ වැදගත්කම මෙලෙසින් සනිටුහන් කරමි.

ඉංග්‍රීසි භාෂාව ලොව ජාත්‍යයන්තර භාෂාව මෙන්ම ලංකාව ජාත්‍යයන්තරයට යා කරන හුයද වන්නේය. එය පෙර පාසලේ සිට දරුවා කෙදිනක හෝ "ගෝලීය විද්වතෙක්"(Global scholar) නිර්මාණය කිරීම තෙක් පුළුල් පරාසයක විහිදෙන අධ්‍යයන පථයකි. මාගේ වසර 16ක ජාත්‍යන්තර විභාග සඳහා ඉගැන්වීමේ පළපුරුද්දෙන් පැවසිය හැකි වන්නේ ජාත්‍යයන්තර විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාග වන IELTS , PTE, TOEFL වැනි විභාග සඳහා අවශ්‍ය මූලික දැනුම පවා වර්ෂ 13ක පාසල් අධ්‍යාපනය නිම වන දරුවාට බොහෝවිට නැති බවය. එය නාගරික මෙන්ම ගම්බද සිසු දරුවන් තුළද අඩුපාඩුවක්ව පවතියි. ජාත්‍යන්තර පාසල් දරුවන් මුල සිටම ඉංග්‍රීසි මාධ්‍යයෙන් සියලු ධාරාවන් හැදෑරීම හේතුවෙන් ඔවුන්ගේ ඉංග්‍රීසි දැනුම තීව්‍ර කරගත යුත්තේ අල්ප වශයෙනි. එසේ වතුදු රජයේ පාසල් වලින් පිටවන දරු පරපුරේ ඉංග්‍රීසි භාෂා පරිචය ඉතා අවම මට්ටමේ පවතින අතර උසස්පෙළ දී ඉංග්‍රීසි භාෂාවට ලබා දී ඇති අවදානය අවම වීම එයට එක් හේතුවක් විය හැක. එසේ හෙයින් කැළනිය, ජයවර්ධනපුර, කොළඹ සරසවි ඇතුළු තවත් පෞද්ගලික සරසවි වලට මාගේ සේවා කාලය තුළ ඇතුළු වූ දරුවන්ට මුලදී අවශ්‍ය ව්‍යාකරණ හැකියාව පවා තිබුණේ අවම මට්ටමකය. සමහර MBBS දරුවන් ඉංග්‍රීසි භාෂාවට ඇති බියෙන් පාඨමාලා හැරයාමට පවා පෙළඹීමක් තිබුණද අපගේ උණන්දුව මත එය එසේ නොවිණි.

ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණයෙකු වීම උදෙසා (Expert uer) දරුවකු ඉංග්‍රීසි ව්‍යාකරණ මෙන්ම කථනය, ලිවීම, සවන්දීම හා කියවීම යන අංග 4 දියුණු කරගත යුතුය. ඒ සඳහා කේම්බ්‍රිජ් සරසවියේ නිර්දේශිත ESOL Exam preparation පාඨමාලා හැදෑරීම අතිශය ප්‍රයෝජනවත් බව දන්වනු කැමැත්තෙමි. එම පාඨමාලා දරුවාගේ මට්ටම අනුව පෙරපාසල් අවදියේ සිට පරිනතවිය දක්වා ඕනෑම වැඩිහිටියෙකුට වුවද හැදෑරිය හැකිය. KET, PET, FCE, CAE ආදී වශයෙන් මට්ටම් රැසකි. මීට අමතරව IELTS, PTE වැනි පාඨමාලා හදාරන දරුවන් එයට අදාල online වෙබ්අඩවි වල ඇති පොත් කියවීම සහ සවන්දීම කළ යුතුය. මීට අමතරව ඉංග්‍රීසි භාෂාව දියුණු කර ගැනීමට දරුවාට හොඳ ව්‍යාකරණ පදනමක්ද දිය යුතුය. නැතිනම් රටේ සිදුවනුයේ වසර 4ක් හෝ 3ක විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසානයේ දී විද්‍යාර්ථයාට නැවතත් හොඳ රැකියාවක් ලබා ගැනීම උදෙසා "Spoken English" පංති සොයා යෑමටය.

දරුවන් ඉගෙන ගැනීමට යැවීමේ දී දෙමාපියන් අත්‍යන්තයෙන් ගුරුවරයාගේ සුදුසුකම් හා ඉගැන්වීමේ පරිචයන් ගැන දැනුවත්විය යුතුමය. සමහර ජාත්‍යන්තර විභාග සඳහා පුරුදු කරන ගුරුවරුන් බොහෝවිට එම විභාගයට වැඩි සුදුසුකමක් හෝ එම විභාගයට පෙනීසිටවත් නැත. එවිට දරුවාට ඉතා හොඳ අධ්‍යාපනයක් ලැබේදැයි සැක සහිතය.



# ඉංග්‍රීසි භාෂාවේ වැදගත්කම හා ශ්‍රී ලාංකික දරුපරපුරේ අනාගතය

ඉංග්‍රීසි භාෂාව මුලසිට පාසල් සිසුවෙකුට නැතහොත් ඕනෑම වයස් අවදියක කෙනෙකුට උත්සාහයෙන් හා පුහුණු මඟ පෙන්වීමකින් පරිනත කර ගත හැකිය. ඉතා හොඳ ඉංග්‍රීසි කථිකයෙකු බිහිවනුයේ තමාගේ සිතිවිලි ඉංග්‍රීසියෙන් සිතෙන් සිතන විටය. එය සිංහලෙන් සිතා ඉංග්‍රීසියට පරිවර්ථනය කර කතා කිරීමට ගිය විට වනුයේ "Hesitancies" ඇති වීමය. එයට ඉංග්‍රීසි ජාතිකයෙකුටත් එය තේරුම් ගැනීම අපහසුය. පළමුව කෙනෙකු ඉංග්‍රීසි භාෂා පොත්, පත්තර, ලිපි, ගුගල් ලිපි කියවිය යුතුය. ඊට පසු ඉංග්‍රීසි ජාතිකයෙකු කතා කරන Accent හුරුවීම පිණිස Listening Channels හැදෑරිය යුතුය. BBC, CNN ආදී ප්‍රවෘති YouTube ඔස්සේ "Subtitles" සමඟ නැරඹිය හැකිය. මීට අමතරව TED Talks ආදී Public speaking channels නිතර Subtitles සමඟ නරඹා "Loud read" කළ යුතුය. මෙලෙස Listening කොටස සාදාගත් පසු Vocabulary හෙවත් වචන මාලාව වැඩි කරගත යුතුය. ඒ සඳහා නොමිලේ online thesaurus එකක් භාවිත කළ හැකිය. ඉංග්‍රීසි කථන හැකියාව වැඩි කර ගැනීමට නොයෙක් උපක්‍රම පර්යේෂණ ලෙස විශ්වවිද්‍යාල පට්ටමේ කර සොයා ගැනීමට මට හැකිවිනි. ඒ අතර Comics හරහා ඉගෙනීම, Dramas හරහා ඉගැන්වීම, Presentations කරවීම, Public speaking කරවීම, Debates (විවාද) කරවීම ප්‍රහල ඉංග්‍රීසි ඉගැන්වීමේ උපක්‍රම වේ. මේ සියල්ල "Expert" මට්ටමට හදා ගැනීමට සති 10 පමණ කාලයක් ප්‍රමාණවත්ය. ඒ සඳහා Materials, Resources ඕනෑතරම් අන්තර්ජාලයේ ඇත. මේවා නිසි ගුරු උපදෙස් යටතේ පුහුණු වුවහොත් ඕනෑම දරුවකුට Native Speaker proficiency level එක ලබාගත හැකිය. හොඳම උදාහරණ වන්නේ ලංකාවෙන් මා ඉගැන්වූ IEITS Band 9 ගත් හා PTE 90/90 ගත් සිසුන්ය. මාස 02ක් පමණ කාලයක් මේ සඳහා සෑහේ.

ඉංග්‍රීසි භාෂාවට ඇති "බිය" පළමුව ලාංකික සිසු දරු කැලෙන් තුරන් කළ යුතුය. භාෂාවක් කෙනෙකුට පිහිටීමට ඒ භාෂාව නිතර භාවිත කළ යුතු වේ. ඒ සඳහා කෘතිමව වටපිටාවක් අන්තර්ජාලය ඔස්සේ ඇති Resources හරහා දරුවාට නිර්මාණය කර දිය හැක.

ඉංග්‍රීසි භාෂා ප්‍රවීණයෙකු වීමේ වැදගත්කම අතිමහත්ය. නව පර්යේෂකයන්, නව නිපැයුම් කරුවන්, ජාත්‍යන්තරය දිනූ මිනිසුන්, වැඩිදුර අධ්‍යාපනය හදාරන විද්‍යාර්ථයන්, විශිෂ්ඨ වෘතිකයන්, රටට විදේශ විනිමය ගෙන්වන ව්‍යවසාහකයන්, online රැකියා කරන්නන් බිහිවනුයේ ඉංග්‍රීසි දැනුමේ පරිචයන් සමඟින්ය. එය ළඟාවිය නොහැකි ඉලක්කයක් නොව ස්ව රට දියුණුවට එය බලපාන ප්‍රධාන සාදකයක් බැවින් සියලු ශ්‍රී ලාංකිකයෝ ඉංග්‍රීසි භාෂා පරිචය පරිණත කර ගත යුතුය. ඔවුනට ලේසියෙන් ජාත්‍යන්තරය ජයගත හැක්කේ මෙය ගෝලීය සංදර්භය තුළ එවිටය. එසේම ධනාත්මක ජාත්‍යන්තර සබඳතා, මෙන්ම සහජීවනයටද එය අත්‍යන්තයෙන්ම උපකාරී වන්නේය. මේ සඳහා සුවහසක් සිසුකැල තුළ "Yes I Can !" යන සෘජු මානසිකත්වයක් නිර්මාණය කිරීම කළ හැක. එය සියලු ඉංග්‍රීසි ගුරුභවතුන්ගේ ප්‍රමුඛ කාර්යය භාර්යකි.

විරාගී උත්පලා අතුකෝරල මෙනවිය
(PhD - Following), MA, BA, TESL, TEFL
Owner British IELTS & English Language Center
University Lecturer with 16 years of experience

British IELTS & English Language Center - 076 797 8983



MG
මයන්ත
ජෙම්ස්
අගනා මැණික් සඳහා
Mr. Mayantha
Proprietor
0775307907


KUMARA GEMS
DEMUWAWATHA
0714 466 993



ලොකු අප්පො
SAMANTHA GEMS
Hakamuwa
071 6180319


GEMCITY
MAGAZINE
දැන්වීම් සඳහා විමසන්න
0740 67 67 84


ULU
GEMS
Mr. Upali
Proprietor
071 630 2317


ANIL
GEMS
Dealers in Genuine Gems
Anil
Proprietor
0777 271 501
DEMUWAWATHA,
RATNAPURA.


පොඩි
නිමල්
Gems
පලාවෙල ( පන්සල පාර )
0713915211


COLOUR
RICH
GEMS
Dealers in Genuine Gems
SASMITHA JAYASOORIYA
Proprietor
0777 299 772
DEMUWAWATHA,
RATNAPURA.


ඔබේ මැණිකට ඉහළ මිලක්
ලොකු
නිමල්
GEMS
පලාවෙල
071 983 8192

# රටේ ගෞරවය දිනාගත් රාජ්‍ය නිලධාරීන් 01



## සෑම් විජේසිංහ මහතා

ශ්‍රී ලංකා පරිපාලනයේ ඉමහත් ගෞරවාදරයට පාත්‍ර වූ චරිතයක් වන සෑම් විජේසිංහ මහතා ගැමි පරිසරයක ඉපිද සරල දිවිපෙවෙතක සිට "බල කොරිඩෝව" දක්වා වූ අද්විතීය සුවිසැරියක නිරත වූවෙකි. ඔහු සිය මූලික අධ්‍යාපනය විජය විද්‍යාලය, මාතර රාහුල විද්‍යාලයෙන්, කොළඹ ආනන්ද විද්‍යාලයෙන් සහ ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයෙන් ලබා ගත් අතර එහිදී ඔහු නායකයෙකු, විද්වතෙක් සහ ක්‍රීඩකයෙකු ලෙස කැපී පෙනුණි.

1944 දී ලන්ඩන් විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලැබීමෙන් පසු විජේසිංහ මහතා ලංකා නීති විද්‍යාලයෙන් නීති අධ්‍යාපනය හැදෑරූ අතර අධිනීතිඥවරයෙකු ලෙස සුදුසුකම් ලැබීය. ඔහු කැනඩාවේ මැක්ගිල් විශ්වවිද්‍යාලයේ වැඩිදුර අධ්‍යාපනය ලබා නීතියපති උපාධියක් ලබා ගත්තේය. 1948 දී නීතිඥවරයෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ ඔහු වසර 15කට අධික කාලයක් ගෞරවනීය නීතිපති දෙපාර්තමේන්තුවේ විශිෂ්ට ලෙස සේවය කළේය.

1964 දී, විජේසිංහ මහතා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ ලේකම් භූමිකාව භාර ගත්තේ, ව්‍යවස්ථාදායක ක්ෂේත්‍රය සමඟ ඔහුගේ කල්පවත්නා ඇසුරේ ආරම්භය සනිටුහන් කරමිනි. ශ්‍රී ලංකාවේ ජනරජ ව්‍යවස්ථාවේ පදනම සකස් කළ ව්‍යවස්ථාදායක සභාවේ ලේකම්වරයා ලෙස ඔහු කේන්ද්‍රීය කාර්යභාරයක් ඉටු කළේය. 1972 දී, ලංකාව, ශ්‍රී ලංකා ජනරජය බවට පත්කිරීමේ ක්‍රියාදාමයේදී, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කිරීමේදී ඔහු විශාල කාර්යභාරයක් ඉටු කළේය. ඒකමණ්ඩල ව්‍යවස්ථාදායකයක් පිහිටුවීමත් සමඟ ඔහු පාර්ලිමේන්තුවේ පළමු මහ ලේකම්වරයා ලෙස පත් කරන ලදී.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී ආචාර ධර්ම යළි හැඩගස්වන පරිවර්තනීය ව්‍යවස්ථාදායක ප්‍රයත්නයන් අධීක්ෂණය කරමින් දශක දෙකකට ආසන්න කාලයක් විජේසිංහ මහතා පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා ලෙස අසමසම අභිමානයෙන් හා උද්‍යෝගයෙන් නායකත්වය ලබාදුන්නේය.



පාර්ලිමේන්තුවෙන් ඔබ්බට විහිදුණු ඔහුගේ පරාර්ථකාමී ආචාර ධර්ම පෙරදැරිව ශ්‍රී ලංකාවේ පළමු පරිපාලනය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) ගේ භූමිකාව හෙබවීම තෙක් පැතිරුණු අතර, එහිදී,ඔහු දශකයක කාලයක් තිස්සේ පරිපාලන වගකීම් සහ පුරවැසි අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටියේය. පසුව ඔහු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කුලපතිවරයා ලෙසද කටයුතු කළේය.

ලංකාවේ පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් මහලේකම් ධූරය දැරූ සෑම් විජේසිංහ මහතා  පක්ෂ විපක්ෂ සියළු දෙනාගේම ගෞරවය ලබා ගන්න සමත් වුණු පුද්ගලයෙක්. එක්සත් ජාතික පක්ෂයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රබලයන් සමඟ පෞද්ගලික ඥාති සම්බන්ධකම් තිබුණ ද තම රාජකාරිය ඉටු කිරීමේදී කිසිලෙසකින්වත් එම සබඳකම් ඔහු බාධාවක් කර ගත්තේ නැහැ. කලවාන අතුරු මැතිවරණය සම්බන්ධයෙන් ව්‍යවස්ථා විරෝධී තීරණයක් ජේ.ආර් ජයවර්ධන රජය විසින් ගත් අවස්ථාවේදී එම තීරණයට ඔහු විසින් දැඩි ලෙස තම විරෝධය පළ කළා පමණක් නොව රජයේ එම උත්සාහය ව්‍යර්ථ කිරීමටත් ඔහු කටයුතු කළා.

2014 දී ගෞරවනීය වයස අවුරුදු 93 දී ඔහු අභාවප්‍රාප්ත වුවද, විජේසිංහ මහතාගේ නාමය ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය නම් ඉතිහාස පොතෙහි අමරණීයව සටහන්ව ඇත. ඔහුගේ කීර්තිමත් දිවිය අනුස්මරණය කරන මේ අවස්ථාවේ, අපගේ දැයට සහ එහි ජනතාවට සේවය සැපයීමට සහ භාරකාරත්වය දැරීමට යළි-යළිත් කැපවීම මඟින් අපි ඔහු පිළිබඳ මතකයට ගෞරව කරමු.



OUR WARMEST CONGRATULATIONS TO

GEMCITY MAGAZINE

PUNSIRI GEMS

PRIYANTHA GEMS


SENARO
SENARO GN125
HIRU TRADERS
SENERO AUTHORIZED DEALER
ශ්‍රී ලාංකීය අපේ මෝටර් සයිකලය
552, COLOMBO ROAD,NEWTOWN, RATNAPURA.
0717 003 030/ 0716 342 604/ 0452 232 633
SENARO GN125 මෝටර් සයිකලය සාඩම්බර ශ්‍රී ලාංකීය ඉදිරිපත් කිරීමක්, වසර 03ක අසම සම වගකීමක් සහිතව ඔබ වෙත එන SENARO GN125 මෝටර් සයිකලය දැන් නගර ගම් දනව් සිසාරා රජ ගමනේ, රළු මාර්ගවල සිට නාගරික මාර්ග දක්වා ඕනෑම තැනක විශ්වාසයෙන් පැද යන්න, උපරිම ඉන්ධන පිරිමැස්මක් සහිත SENARO GN125 මෝටර් සයිකලය ඔබගේ ගමනාන්තය වෙත ඔබව ආරක්ෂාකාරීව අභිමානයෙන් රැගෙන යයි..
හෙල්මට් සහ සේවා වාර හතරක් නොමිලේ
HIRU TRADERS
SENARO
GN125
4 YEARS WARRANTY
4 FREE SERVICE
BRAND NEW


RAJU
GEMS
Dealers in Genuine Gems
Office:
DEMUWAWATHA
Ratnapura,
0777 57 44 11


anura gems
Gem Dealer & Exporter
Anura Subasinghe
Director
Tel : 0777 24 38 74
0775 88 11 90
Mail : gemsanura@gmail.com

SARATH GEMS

S.H. SARATH KUMARA
Proprietor



(මන්ත්‍රී මල්ලි)

PATHAGAMA, KURUWITA
RATNAPURA


045 2264236
045 7200899
077 6695109
077 6334759

# EPF / ETF

සේවකයින්ට කලට වේලාවට EPF, ETF ගෙවීම ආයතන හිමිකරුවෙන්ගේ ප්‍රධානතම වගකීමකි. එය නිසි ලෙස සිදු නොවුණහොත් අනවශ්‍ය ලෙස දඩ මුදල් පවා ගෙවන්නට සිදුවන අවස්ථා ද ඇත. එසේ වුවහොත් රජයෙන් එම ආයතනයට රතු නිවේදනයක් පවා ලැබෙන්නට ඉඩකඩ ඇත. එම නිසා ආයතනයක හිමිකරුවෙක් ලෙස EPF, ETF පිළිබඳව දැනගැනීම ඉතාම වැදගත්.

## EPF

ඕනෑම රජයේ සේවකයෙක්ට විශ්‍රාම ගියවිට විශ්‍රාම වැටුපක් ලෙස මාසිකව යම්කිසි මුදලක් ලැබේ. එමෙන්ම පෞද්ගලික අංශයේ සේවකයින්ටද විශ්‍රාම යන දිනයට දිරිගැන්වීමක් ලෙස යම් මුදලක් ලබා දීම EPF හි ප්‍රධාන අරමුණයි. යම් ආයතනයක එක් සේවකයෙක් හෝ නැත්නම් EPF ගෙවීම අවශ්‍ය නොවනු ඇත. නමුත් ආයතනයක එක් සේවකයෙක් හෝ සිටී නම් ඔහුට අනිවාර්යයෙන්ම EPF ගෙවිය යුතුයි. එමෙන්ම EPF ගෙවීම් කෙරෙන්නේ ස්ථිර රැකියාලාභීන්ට පමණක් යැයි බොහෝ දෙනෙක් අතර ඇති වැරදි මතයකි. නමුත් ආයතනයක යම් සේවකයෙක් තාවකාලිකව හෝ සේවයේ යෙදේ නම් ඔහු සේවය ඇරඹූ පළමු දිනයේ සිට EPF ගෙවීම ආයතනයේ වගකීමක් වෙයි.


"D" Annexure of Form "D"
Commissioner of Labour,
Employees' Provident Fund Office,
P.O. Box 1508, Colombo 05.
Name of the institution or estate
Name | Date of Appointment | Salary on that date | Nature of employment | Age of employee on the date of appt. | I.D. Number | Personal address
Personal address/es of the employer/employers.-
(c)
(d)
3.
(a)
(b)
(4) Date of which you become the owner/lessee of the institution /estate:-
(5) If EPF had been paid earlier, the number:-
(6) The number of employees who have served me/us to whom the contributions were paid under that number/
(7) The completed and singed "D" form is annexed hereto.
the names and personal addresses of the persons and the date of change of
Signature of employer

## EPF ගෙවීම් කරන්නේ කොහොමද?

තමන් යටතේ සිටින සේවකයින්ට EPF ගෙවීම සඳහා නිසි ක්‍රියාපටිපාටියක් තිබේ. ඒ සඳහා මුලින් ම කම්කරු දෙපාර්තමේන්තුවේ (Labor Department ) ලියාපදිංචි විය යුතුයි. ඒ ලියාපදිංචි වීම තරහා යම් ආයතනයක් EPF ගෙවීම් සිදු කරන ආයතනයක් ලෙස රජය විසින් හඳුන්වනු ලබයි. ඒ සඳහා Form D ලෙස හඳුන්වන ලේඛනය පුරවා දිය යුතු අතර එහි අන්තර්ගත වන්නේ ආයතනයේ මූලික විස්තර පමණකි. ආයතන ලියාපදිංචි සහතිකය සමඟ Form D ලේඛනය කම්කරු දෙපාර්තමේන්තුවට භාරදීමෙන් අනතුරුව කම්කරු දෙපාර්තමේන්තුව විසින් එම ආයතන වලට වෙන්වුණු EPF අංකයක් ලබා දෙනු ලැබේ. සාමාන්‍යයෙන් පුද්ගලයෙක්ව හඳුනාගන්න ජාතික හැඳුනුම්පත භාවිත කෙරෙන අතර යම් ආයතනයක් හඳුනාගන්නට මෙම EPF අංකය භාවිත කෙරේ. ඕනෑම ආයතනයක සෑම සේවකයෙක්ම යම් දවසක විශ්‍රාම ලැබීමෙන් පසුව ඔවුන්ට අදාල EPF මුදල ලබා ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට ගිය විට ඔවුන්ගේ අනන්‍යතාවය තහවුරු කරන්නට සාක්ෂි ඉදිරිපත් කළයුතු වේ. ඒ සඳහා B card ලෙස ලේඛනයක් හඳුන්වා දී ඇති අතර යම් ආයතනයක සේවය කරන ඕනෑම සේවකයෙක් මේ ලේඛනය සේවය ආරම්භයේදීම අනිවාර්යයෙන්ම පුරවාදිය යුතු වේ. මෙම ලෙඛනයේ අන්තර්ගත වන්නේ සේවකයාගේ නම, සේවකයාගේ පවුලේ විස්තර, ඔහුගෙන් පසුව EPF මුදල ලැබිය යුතු පුද්ගලයාගේ නම, සේවකයාගේ ඇඟිලි සලකුණ වැනි මූලික තොරතුරු කිහිපයක් පමණකි.

යම් සේවකයෙක් ආයතන කිහිපයකම සේවය කර ඇත්නම් ඒ ඒ ආයතන වලට අදාලව B card කිහිපයක්ම ඒ පුද්ගලයා සතුව තිබිය හැක. එම නිසා ආයතන හිමිකරුවන්ගේ වගකීම වන්නේ යම් සේවකයෙක් තම ආයතනයෙන් සමුගන්නා දිනට අනිවාර්යයෙන්ම ඒ සේවකයාට අයත් B card එක ලබා දීමයි.

## EPF ගණනය කරන්නේ කොහොමද?

EPF සැකසීමේ දී ආයතනික හිමිකරුගේ වගේම ආයතනික සේවකයන්ගේ ද දායකත්වය අත්‍යවශ්‍ය වේ.
යම් සේවකයෙක් ලබා ගන්නා සේවක වැටුපෙන් 8% ක කොටසක් ද එම වැටුපෙන් 12% ක කොටසක් ආයතනයෙන් ද EPF මුදල වෙනුවෙන් වෙන් කෙරේ.

## EPF සඳහා සලකා බලන මුදල.

යම් සේවකයෙක්ගේ මූලික වැටුපට අයවැය දීමනාවක් (Bonus) එකතු වූ විට ලැබෙන වැටුප EPF ගණනය සඳහා යොදා ගැනේ. යම් සේවකයෙක් අමතර වේලාවක් (OT) සේවය කර යම් මුදලක් ලබා ගන්නේ නම්, කොමිෂන් එකක් ලබා ගන්නේ නම් හෝ Performance - Based allowance ( කාර්ය සාධනය- පදනම් දීමනාව) ලබා ගන්නේ නම් එම මුදල EPF සකසන මුල් වැටුපට එක් නොකෙරේ.

උදා:-

EPF සඳහා සලකා බලන සේවකයෙකුගේ වැටුප = රු. 100,000

| | |
|---|---|
| සේවකයාගේ වැටුපෙන් ඍජු සඳහා | = රු. 100,000 X 8% |
| වෙන්කෙරෙන මුදල | = රු. 8,000 |
| ආයතනයෙන් EPF සඳහා වෙන් කරන මුදල | = රු. 100,000 X 12% |
| | = රු. 12,000 |
| සේවකයාගේ සම්පූර්ණ EPF මුදල | = රු. 12,000 + රු. 8,000 |
| | = රු. 20,000 |
| සේවකයෙක්ට ලැබෙන මුළු මාසික වැටුප (Performance - Based allowance ) හැර | = රු. 100,000 - රු. 8,000 |
| | = රු. 92,000 |

## සේවකයෙක්ට EPF ගෙවන්නේ කොහොමද?

මේ සඳහා සේවකයින්ට වෙන වෙනම ලේඛන සකස් කිරීම අවශ්‍ය නොවේ. ඒ වෙනුවෙන් Form C ලෙස තනි ලේඛනයක් හඳුන්වා දී ඇත. ඒ හරහා සේවකයින්ගේ EPF ගෙවීම් කටයුතු සිදු කර හැක.

Form C හි අන්තර්ගතවන විස්තර

* සේවකයින්ගේ නම්
* හැඳුනුම්පත් අංක
* EPF සඳහා සේවක වැටුපෙන් වෙන්වන මුදල
* EPF සඳහා ආයතනයෙන් වෙන්කෙරෙන මුදල

මසකට අදාල "Form C" ඉදිරි මාසය අවසාන වීමට පෙර අදාල මුදලත් සමඟ කම්කරු දෙපාර්තමේන්තුවට ලබා දිය යුතුය. උදාහරණයක් ලෙස ඔක්තෝම්බර් මාසයට අදාල Form C එක නොවැම්බර් මාසයේ 30 වෙනිදාට පෙර ලබා දිය යුතුය.

අදාල දිනයට පෙර EPF ගෙවන්න බැරිවුනොත් මොකද වෙන්නේ?

ආයතනයක හිමිකරුවෙක් ලෙස EPF ගෙවීම් ප්‍රමාද වෙන්න වෙන්න ඒ සඳහා ගෙවිය යුතු දඩ මුදල ද වැඩි වේ. උදාහරණයක් ලෙස

දින 1 සිට 5 දක්වා - 5%ක්

දින 10 සිට 30 දක්වා - 15% ක දඩ මුදලක් කම්කරු දෙපාර්තමේන්තුවට ගෙවිය යුතුය. එමෙන් ම නිසි වේලාවට EPF ගෙවීම් සිදු කරන බව තහවුරු කළ හැකි සාක්ෂියක් ආයතනයේ හිමිකරු සතුව තිබිය යුතුයි. ඒ සඳහා පවත්වාගෙන යා යුතු ලේඛන කිහිපයක් තිබේ.

## EPF ගෙවීම සඳහා අවශ්‍ය වන ලේඛන

* පත්වීම් ලිපිය
* පැමිණීමේ විස්තර
* වැටුප් ලේඛනය
* ගෙවීමේ පත්‍රිකාව
* Form C හි පිටපතක්

## ETF

ETF ද EPF සේම වැදගත් වේ. යම් සේවකයෙක් සේවයට පැමිණෙන පළමු දිනයේ සිට EPF සේම ETF මුදල ද ඔවුනට ලැබේ. ඒ වෙනුවෙන් වෙනම ලියාපදිංචි අංකයක් අවශ්‍ය නොවේ. ඒ සඳහා EPF වෙනුවෙන් ලබා දුන් ලියාපදිංචි අංකයම භාවිත කළ හැක. මෙමඟින් සේවකයෙක් ලබා ගන්නා මාසික වැටුපෙන් 3%ක කොටසක් ETF වෙනුවෙන් ආයතනයෙන් වෙන් කෙරේ. එමෙන්ම ඒ සඳහා සේවක වැටුපෙන් කිසිම මුදලක් වෙන් නොකෙරේ.

ETF සඳහා ද ලේඛනයක් සැකසිය යුතුය. ආයතනයක සිටින සේවක සංඛ්‍යාව අනුව ඊට අදාල ලේඛනය තීරණය කෙරේ. ආයතනයක සේවක සංඛ්‍යාව 15ට වඩා වැඩිනම් R1 යන Form එකත් සේවක සංඛ්‍යාව 15ට අඩුනම් R4 යන Form එකත් සැකසිය යුතුයි.

ආයතනයක් පවත්වාගෙන යන ඕනෑම කෙනෙක් EPF සහ ETF ගෙවීම අනිවාර්යය වේ. නමුත් යම් අයෙක්ට මේ ලේඛන සකස් කිරීමෙහි අපහසුතාවයක් පවතිනම් ඒ සඳහා අවශ්‍ය සහයෝගය දක්වන ආයතන බොහොමයක් මේ වන විට ලංකාව තුළ පවත්වාගෙන යයි. ආයතන ලියාපදිංචි කිරීමේ ආයතන හරහා මෙම සේවාවන් ලබාගත හැකිය.



ප්‍රදීපා ජයසූරිය

# ලොව දුර්ලභ හා වටිනා මැණික්

ඉතිහාසය පුරාම මිනිසුන් ස්වර්ණාභරණවලින් තමන්ගේ ශරීරය සරසා ඇත - පළමුව අස්ථි කටු හා දීප්තිමත් පාෂාණ කැබලි වලින් සාදාගත් ආභරණ භාවිතා කර ඇත ඉන් පසුව තඹ, රිදී හා රන්,මැණික් තබා ආභරණ සදා පැලඳ ඇත.

මැණික් වල ස්ඵටික ස්වභාවය සඳහා වසර මිලියන ගණනක් ගතවේ. පොළව අභ්‍යන්තරයෙන් ගන්නා ස්ඵටික පටක පසුව කපා ඔපදමා දියමන්ති මැණික් ගල් ලෙස විකුණනු ලැබේ. මැණික් වල වටිනාකම කාසි වල දුර්ලභත්වය, ගුණාත්මකභාවය, සැකසුම, මෙන්ම දේශපාලනය ඇතුළු බොහෝ සාධක මත රඳා පවතී.



## ටැන්සානයිට්

නිල් සහ දම් මිශ්‍ර මෙම මැණික් විශේෂය ලොව සොයා ගැනීමට ඇත්තේ උතුරු ටැන්සානියාවේ කඳු අතර පිහිටි කුඩා කඳු පාමුල් වලින් පමණය. ඉහල වටිනාකමින් යුත් මෙම මැණික් විශේෂයේ අගය උතුරු ටැන්සානියාවේ පවතින යුධ වාතාවරණය හේතුවෙන් තව තවත් ඉහල යනු ඇතැයි ලොව මැණික් වෙළෙන්ඳන් සඳහන් කරයි.

මෙහි කැරට් එකක මිල ඇමෙරිකානු ඩොලර් 600ත් 1000ත් අතර වේ.



## ටැෆයිට්

1945 දී ගල් කැපීම හා ඔප දැමීමේ කලාව සොයාගත් ඕස්ට්‍රේලියානු ජාතික රිචඩ් ටාෆේ මහතාට ගෞරවයක් වශයෙන් මෙම මැණික් විශේෂය Taaffeite නමින් හඳුන්වා ඇත. මෙම අගනා ගල් අතලොස්සක් පමණක් මැණික් එකතු කරන්නන් අතරින් මෙතෙක් සොයාගෙන ඇත.

නීලලෝහිත,ලැ◌ෙවන්ඩර් වර්ණ සහ දම් පැහැ වර්ණ පරාසයක් තුල දැකගත Taaffeite මැණික් විශේෂය දැක ගත හැක. ශ්‍රී ලංකාව හා ටැන්සානියාව අතර මෙම විශේෂය දැක ගත හැක. වෙනත් භූමි පරාසයන් තුල මෙම මැණික් විශ්ශය සොයාගන්නාතුරු Taaffeite ලෝකයේ දුර්ලභ හා වඩාත්ම වටිනා මැණික් අතරින් එකක් ලෙස පවතී.

මෙහි කැරට් එකක මිල ඇමෙරිකානු ඩොලර් 1500ත් 2500ත් අතර වේ.





## බ්ලැක් ඔපල්

ඔපල් නමින් ඇති දුර්ලභ මැණික් විශේෂයකි. මෙම වර්ගය ඕස්ට්‍රේලියානු ජාතික මැණික් විශ්ශය ලෙසද නම් කර ඇත. මෙයින් කලු ඔපල් එම වර්ගයේ ඉතාමත් වටිනා මැණික් විශේෂය වේ. සියළුම පාහේ කළු ඔපල් නිව් සවුත් වේල්සයේ Lightning Ridge (අකුණු රිඩ්ජ්) බිම් ප්‍රදේශයෙන් ලෝක වෙළඳ පොළට පැමිණේ.


මෙම අඳුරු මැණික් විශේෂය සිය සාපේක්ෂ හිඟයත් සමඟ වටිනාකමින් ඉහළ යාමට හේතු වේ. කැරට් එකක් ඩොලර් 2300 ක් පමණ වේ.

## මස්ග්‍රාවිට්



"Musgravite" Taaffeite,පවුලේ තවත් වටිනා දුර්ලභ මැණික් විශේෂයක් වේ. මෙම ගල් විශේෂය අළු සිට දම් පැහැ වර්ණ පරාසයක් පෙන්නුම් කරයි . Musgravite දකුණු ඕස්ට්‍රේලියාවේ මස්ග්‍රෙව් භූමි ප්‍රදේශය තුළ 1967 දී සොයා ගත් අතර, වසර ගණනාවක් තිස්සේ ප්‍රමාණයෙන් අවකට වඩා කිසිවක් නොලැබිණි.

මෑතකදී, Musgravite සුළු ප්‍රමානයක් ග්‍රීන්ලන්තය,ඇන්ටාක්ටිකාව, ශ්‍රී ලංකාව, මැඩගස්කර් සහ ටැන්සානියාවෙන් හමු වී ඇත. කැරට් අනුව මෙම දුෂ්කර ගල් විශේෂය ඩොලර් 35,000 ක් හෝ ඊට වැඩි ගණනකට අලෙවි වේ.



## බෙනිටොයිට්

කැලිෆෝනියාවේ සැන් බෙනිටෝ ගඟ අසල තිබී, Benitoite නම් මෙම විශේෂය පළමුව පාරජම්බුල ආලෝක යටතේ 1907 දී සොයාගෙන ඇත. දම් සහා නිල් මිශ්‍රව එය විශිෂ්ට පැහැයෙන් බබළනවා. මෙම විශේෂයේ සුළු නිදර්ශක ආකැන්සාස් හා ජපානයෙන් සොයාගෙන තිබේ, නමුත් එකම වාණිජ නිජ බිම වන්නේ සැන් බෙනිටෝ කවුන්ටි, කැලිෆෝනියාවේ වේ.
කැලිෆෝනියාවේ නිල රාජ්‍ය මැණික් විශේෂය Benitoite වේ. ඉතා කලාතුරකින් මැණික් එකතු කරන්නන් අතරින් මෙම විශේෂය සොයා ගැනීමට හැකි අතර ඉතා අල්ප වශයෙන් රන් ආභරණවල ඇතුලත් කොට අලෙවි කර ඇත. මෙහි කැරට් එකක මිල ඇමෙරිකානු ඩොලර්3000ත් 4000ත් අතර වේ.



## බෙනිටොයිට්

Beryl (රතු බ'ර්යිල්),එසේම Scarlet Emerald (ලෝහිත එමරල්ඩ්) හෝ bixbite ලෙස මෙම විශේෂය හඳුන්වයි. මෙම විශේෂය ඌටා සහ නිව් මෙක්සිකෝවෙන් පමණක් සොයා ගෙන ඇති අතර එකම වාණිජ නිජ බිම වන්නේ ඌටා හි Wah Wah කඳු පන්තිය වේ .

Red Beryl, රන්වලට වඩා 1000 ගුණයක් වටිනා බව විස්තර කර ඇත. කැරට් එකක මිල ලෙස ඩොලර් 10,000 දක්වා ඇත.

## ඇලෙක්සැන්ඩ්‍රයිට්



රුසියාවේ සාර් වූ ඇලෙක්සැන්ඩර් II ලෙස මය නම් කර ඇති මේ දුර්ලභ මැණික් විශේෂය රුසියාවේ Ural කඳුවැටි 1830 දී මුලින්ම සොයාගෙන ඇත.
Alexandrite වර්ණ වෙනස්වෙන මැණික් විශේෂයක් වේ, එහි පැහැය ආලෝකය මත පදනම්ව රතු සහ කොළ බවට වෙනස් වේ.
මෑත කාලයේදී බ්‍රසීලය, නැගෙනහිර අප්‍රිකාව සහ ශ්‍රී ලංකාව යන රටවල් තුලින් මෙම විශේෂය ලෝක වෙළඳ පොළට නිකුත් කර ඇති මුත් තවමත් මෙම විශේෂයට ලෝකයේ ඇනැමුන් තවමත් දැඩි ආශාවක් දක්වයි. මෙහි කැරට් එකක මිල ඇමෙරිකානු ඩොලර් 12000 පමණ වේ



## ජේඩයිට්

මෙම ඇදහිය නොහැකි තරම් දුර්ලභ මැණික් විශේෂය වටිනාකමින් බොහෝ ගුණයක්වෙ.Jadeite "ජේඩ" ලෙස හඳුන්වන මෙම අව්ධිමත් විශේෂය ගැඹුරු,කොළ පැහැති විට අතිශයින් අගය වැඩි වෙ Jadeite ප්‍රධාන වශයෙන් සීමිත ප්‍රමාණයක් මියන්මාරයේ දක්නට ලැබේ.


1997 දී, ක්‍රිස්ටීස් වෙන්දේසිදී Jadeite මාලයක් ඩොලර් මිලියන 10 කට විකුණා තිබෙ. කපා ඔප දැමූ විට වැඩිම ගුණාත්මක "ඉම්පීරියල්" Jadeite කැරට් අනුව ඩොලර් මිලියන ගණනනකට අලෙවි කර ගත හැකිය.
 මෙහි කැරට එකක මිල ඇමෙරිකානු ඩොලර් 20,000ක් පමණ වේ.

1950 දී, ඛනිජ සම්පත් පිලිබඳ විශේෂඥයෙකු වන ආතර් සි.ඩි පේන් (Arthur C.D. Paine) විසින් දුඹුරු පැහැ දුර්ලභ පාෂාණයක් මියන්මාරය (බුරුමය) දී සොයා ගත්තේය. එය මෙතෙක් දුර්ලභ වූ මැණික් විශේෂයක් බවට පත් විය. දශක ගනනාවක් තිස්සේ, දෙකක් පමණ වූ අඩු ප්‍රමානයක් මෙම විශේෂයෙන් හමු වී ඇත. මෙම අති දුර්ලභ රතු-දුඹුරු,තැඹිලි මැණික් සඳහා වෙළෙඳපොලේදී කැරට් එකකට ඩොලර් 50,000 ක් ඩොලර් 60,000 ගෙවීමට අපේක්ෂා කරති.



## පින්ක් ස්ටාර් ඩයමන්ඩ්

"රෝස ස්ටාර් දියමන්තිය" දකුණු අප්‍රිකාවේදී 1999 දී සොයා ගැනින,"විසිතුරු පැහැදිලි රෝස" දියමන්තිය කිරා මැන බලද්දී එය කැරට් 59.6 විය මෙම මැණික වාර්තාගත ඩොලර් මිලියන 83 ක් සඳහා සොතෙබි ගේ විසින් අලෙවි කරන ලදී එය එතෙක් මෙතෙක් මාණික්‍යකයට ලැබුණු ඉහලම මිල වෙ.
වෙළඳ පොළ වටිනාකම ඩොලර් 83,187,381හෝ කැරට් අනුව ඩොලර් 1,395,761 වෙ



## RIZVIK GEMS
**Dealers in Genuine Gems**

**A.I.M. Rizvik**
Proprietor

**Office:**
No. 411, Kudugalwatta,
Ratnapura,
Sri Lanka.

Tel 045 - 2222077
Mobile 071 - 2722225

**Residence:**
No. 51, Ratanajothi Mawatha,
Godigamuwa, Ratnapura,
Sri Lanka.
Tel : 045 - 2223118

No. 17, Subadra Mw, Madiwela,
Colombo,Sri Lanka.
Tel : 011 - 2779558

E-mail : rizvikgems552@gmail.com

## ATHAPATTU GEMS
**Dealers in Genuine Gems**

KUDUGALWATTA | 0777 512560



## ANANDA GEMS
**Dealers in Genuine Gems**



**Mr.Ananda**
Proprietor

Gileemale, Sri Lanka.
0777 438 606

## Salon Anoma

Ladies
**268, Bambalapitiya Flats,**
**Galle Road, Colombo 04.**
**011 2 596 862 / 011 2 591 214**

Gents
268, Bambalapitiya Flats,
Galle Road, Colombo 04.
011 2 588 848 / 011 2 504 115

Unisex
123, Hill Street, Dehiwala.
011 2 731 603 / 011 2 719 181

SALON ANOMA

salon.anoma@yahoo.com

# RANEKA GEMS

GEMS & LAPIDARY



**OFFICE**

077 7517955
045 3461298

No.51, Municipal counciL
Avenue, Ratnapura,
Sri Lanka.

**RESIDENCE**

071 5934270
045 2225963

No.52/5-C, Rosemary
Garden, Mudduwa Road,
Ratnapura, Sri Lanka.


සියලුම වයරින් කටයුතු සඳහා අවශ්‍ය
THREE PHASE
SINGLE PHASE
ELECTRICAL ITEM
තොග වෙළඳාම සඳහා අමතන්න
ANAGI ENTERPRISES
නො. 11/03, පොල්හේන්ගොඩ, රත්නපුර
0743 390 033
0710 514 807
ORANGE ACL DIMO Polycrome KELANI CABLES GREEN hager CHNT


Pidilite
DR. FIXIT
WATERPROOFING EXPERT
ගෙදර ජලකාන්දු නොවෙන්න,
DR. FIXIT පාවිච්චි කරන්න.
ජලකාන්දු වළකන මහා නාමය
DR. FIXIT 101 LW+
DR. FIXIT 112 PIDIFIN 2K
විස්තර දැනගන්න 0117 608088
drfixitlanka.com


රාජපක්ෂ ජෙම්ස්
RAJAPAKSHA
GEMS
071 856 9143
076 663 0005
අඹලහයට, සේනානායක මාවත, රත්නපුර.


Salani
GEM &
JEWELRY
077 0747119
DEMUWAWATHA,
RATNAPURA.

JI GEMS

M.M.M. IHUSHAN
M.R.JESMIN
MANAGING DERECTORS

+94 777 30 72 52
+94 714 29 05 61

NO.6, ZAVIA MAWATHA,
RATNAPURA, SRI LANKA.

ihushanm@icloud.com
jesminrauf@gmail.com

Senevirathne Gems

Sugath Senevirathne
*The proprietor*

No. 7/9 Saranankara Mawatha
Hidellana, Ratnapura,
Sri Lanka

0777 405518
0452 228015

# Mining industry in Sri Lanka



# SAPPHIRUS

*Diamond Like Sapphires*

RATNAPURA

SAPPHIRUSLANKA.COM

@sapphiruslanka

Sapphirus Lanka